වාර්ෂික වාර්තාව
2022



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு வலு அதிகாரசபை
Sri Lanka Sustainable Energy Authority

www.energy.gov.lk

වාර්ෂික වාර්තාව
2022



www.energy.gov.lk

පටුන

අප ගැන

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 01
දැක්ම / මෙහෙවර 03
අපගේ ඉලක්ක / මූලික හරයන්/ අරමුණු 04
ආයතනික සන්ධිස්ථාන 07
කාර්ය සාධනය / ජයග්‍රහණ 09
සභාපතිතුමාගේ පණිවුඩය 11
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය 13
කළමනාකරණ මණ්ඩලය 15
විගණන සහ කළමනාකරණ කමිටුව 16

ආයතනික පාලනය

ආයතනික පාලනය 17
අවදානම් කළමනාකරණය 18

ආයතනික ව්‍යුහය / ප්‍රධාන අංශ 19
කාර්ය මණ්ඩල තොරතුරු 21

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ 23
2023 වසරේ ක්‍රියාකාරී සැලැස්ම 34

මූල්‍ය තොරතුරු

අදායම් ප්‍රකාශය 35
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 36
ප්‍රාග්ධන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 37
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 38
අයවැයගත හා සත්‍ය මුදල් ප්‍රමාණයන් අතර සන්සන්දනාත්මක ප්‍රකාශය - 2022 39
මූල්‍ය ප්‍රකාශවලට සටහන් 43

විගණන වාර්තා

ජාතික විගණන කාර්යාලයේ විගණන වාර්තාව 64
2022 වසරේ විගණකාධිපති වාර්තාව සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිරීක්ෂණ 73





රටේ බලශක්ති සංක්‍රමණයේ ගමන් මඟ

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත ප්‍රකාරව 2007 වසරේ ඔක්තෝබර් මස පළමු වැනි දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්ථාපනය කරන ලදී.



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති විප්ලවයේ පුරෝගාමී පාලන ආයතනයයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන ලද්දේ දිවයින පුරා විහිදී ඇති පුනර්ජනීය බලශක්ති ප්‍රභවයන් ක්‍රියාශීලීව හඳුනා ගැනීම, චිමඟින් කාර්යක්ෂම, ඵලදායි සහ පරිසර හිතකාමී ලෙස බලශක්ති අවශ්‍යතා සපුරාලමින්, බලශක්ති කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ ප්‍රධාන ආයතනය යන අරමුණ ඇතිව ය.

ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනයේ එවැනි තීරණාත්මක ක්ෂේත්‍රයක් හසුරුවන ආයතනයක් ලෙස, මෙරට බහුලව ඇති සූර්ය, සුළං, ජලය සහ පෙව බලශක්ති ප්‍රභවයන් අඛණ්ඩව සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වන අපගේ අරමුණයි. අනාගතයේදී පිරිසුදු, තිරසාර සහ දේශීය වශයෙන් සපුරා ගන්නා ලද බලශක්ති පරිභෝජනයක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවනු පිණිස බලශක්ති ක්ෂේත්‍රයේ උපාය මාර්ගික ආයෝජන දිරිමත් කිරීම අප විසින් අපේක්ෂා කෙරේ.

එමෙන්ම ම නව්‍ය බලශක්ති විසඳුම් සහ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීමට හේතුවන පර්යේෂණ හා සංවර්ධනය ද, දැනුම ලබාදීම ද, සිදු කරමින් අප රට සතු බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමට අපේක්ෂිත ය.



දැක්ම

තිරසාර සහ
බලශක්ති
සුරක්ෂිත
ශ්‍රී ලංකාවක්

මෙහෙවර

පුනර්ජනනීය බලශක්තියට,
බලශක්ති කාර්යක්ෂමතාවයට
සහ බලශක්ති තිරසාරත්වයට
නායකත්වය දෙමින්,
බලශක්ති සුරක්ෂිතතාවය වෙත යන
මාවතේ ජාතික ආර්ථිකයට මෙන්ම
පෘථිවිය මත ඇති බලපෑම අඩු
කරමින්, සුසාධනයෙන්,
නියාමනයෙන් හා
දැනුම් කළමනාකරණයෙන්,
රටේ බලශක්ති සංක්‍රාන්තියට
මංපෙත් හෙලි කරමින්,
සුනිත්‍ය බලශක්ති අගය දාමයන්
ස්ථාපනය කිරීම.

අපගේ ඉලක්ක

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ දැක්ම සහ මෙහෙවර සාර්ථක කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද යන්න සඳහා ඉලක්ක මඟින් මඟ පෙන්වීමක් කෙරේ. උපාය මාර්ගික අරමුණු, උපාය මාර්ග සහ ක්‍රියාකාරකම් සැකසීම සඳහා ඉලක්ක වැදගත් වේ. ඒ අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හඳුනාගෙන ඇති ඉලක්ක මෙසේ ය:


- ☑ ප්‍රාථමික බලශක්ති සැපයුමේ පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය වැඩි කිරීම
- ☑ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කරමින් ද, බලශක්ති සංරක්ෂණය සිදු කරමින් ද සියලු අංශවල ඇති බලශක්ති නාස්තිය අවම කිරීම.
- ☑ ආර්ථිකය ශක්තිමත් කරනු වස්, ප්‍රබල තිරසාර බලශක්ති වැඩසටහන් සැකසීමට හේතුභූත වන පරිසරයක් නිර්මාණය කිරීම
- ☑ පරිහරණයෙන් පරිසරයට විමෝචනය කෙරෙන හරිත වායු ප්‍රමාණය අවම කිරීමට දායකවීම
- ☑ තිරසාර බලශක්ති වැඩසටහන්වලට සශ්‍රීක පරිසරයක් සැපයීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් සැකසීම
- ☑ සමාජය, බලශක්තිය පිළිබඳ සවිඥානික සමාජයක් බවට පරිවර්තනය කිරීම

මූලික හරයන්


මූලික හරයන්
තිරසාර බව
ඉදිරි පරම්පරා සඳහා ප්‍රතිලාභ දිගු කාලීන වශයෙන් අවධාරණය කරන්නා වූ සමාජීය, ආර්ථික හා පාරිසරික වශයෙන් තිරසාර සහ සවිඥානික අධිකාරියක් වීම
විශ්වාසනීයත්වය
අධිකාරියේ පාර්ශ්වකරුවන් අතර සහ සමාජයේ විශ්වාසදායී ලෙස ද ආචාර ධර්ම ආරක්ෂා කරමින්ද වෘත්තීය මට්ටමෙන් ද ක්‍රියා කිරීම අධිකාරියේ ඉහළ ම අභිරුචිය වේ.
අබණ්ඩ අභිවෘද්ධිය
ක්‍රියාවලීන්, පුද්ගලයින් සහ සම්පත් අබණ්ඩව වැඩිදියුණු කිරීම සහ ඒවාට වටිනාකමක් එකතු කිරීම. නව්‍යතාවයෙන් යුත් දේ ද, ප්‍රතිලාභ ද ජාතියට අත්කර දීම. ඒ අතර අධිකාරියේ දියුණුව ද අධීක්ෂණය කිරීම.
මහජනතාව වෙත යොමුවීම
ජාතික වගකීමට දායක වන අතර ම රටේ සංවර්ධනයට සහාය ලබාදීම අරමුණ කර ගැනීම. දැනුවත් කිරීම හා ප්‍රජාවට දැනුම බෙදාදීම මෙන්ම ප්‍රාදේශීය ආර්ථිකය නඟා සිටුවීමට සහාය ලබාදීම.

අරමුණු

2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතෙහි, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූලික අරමුණු නියම කර තිබේ. එම අරමුණු පහත පරිදි ය:




බලශක්ති සුරක්ෂිතතාව ඉහළ නැංවීම සහ එමඟින් රටට ආර්ථික සහ සමාජීය ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ අරමුණ ඇතිව පුනර්ජනනීය බලශක්ති සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ සංවර්ධනය කිරීම.



ගෘහස්ත, වාණිජ, කෘෂිකාර්මික, ප්‍රවාහන සහ අනෙකුත් අදාළ ක්ෂේත්‍රවල බලශක්ති භාවිතය සඳහා බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් හඳුනාගැනීම, ප්‍රවර්ධනය, පහසුකම් සැපයීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම.



ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමෙන් හා විශ්ලේෂණය කිරීමෙන් ද, අදාළ තොරතුරු කළමනාකරණය කිරීමෙන් ද රටෙහි බලශක්තිය බෙදා හැරීමේ ආරක්ෂාව, ප්‍රවර්ධනය සහ පිරිවැය ඵලදායිතාව ඇති කිරීම.



අධිකාරියේ අරමුණු ක්‍රියාවට නැංවීම සඳහාත්, බලශක්තිය සඳහා අවම ආර්ථික පිරිවැයක් ඇති කිරීම සඳහාත්, ජාතියට බලශක්ති සුරක්ෂිතභාවය ලබාදීම සඳහාත් අධිකාරිය සතුව ප්‍රමාණවත් අරමුදල් පවතින්නේ ද යන්න සහතික කිරීම.

ආයතනික සන්ධිස්ථාන

01). බලශක්ති ක්ෂේත්‍රයේ යහපැවැත්ම උදෙසා හිතකර ප්‍රතිපත්ති සකස් කිරීම

02). පුනර්ජනනීය බලශක්ති අංශය වැඩි කිරීම

03). බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

04). මහජනතාව බලගැන්වීම



2007

- ☑ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්ථාපනය කිරීම
- ☑ 6 වන ශ්‍රේණියේ සිට 11වන ශ්‍රේණිය දක්වා වූ ජාතික විද්‍යා විෂයමාලාවට තිරසාර බලශක්ති විෂයය හඳුන්වාදීම
- ☑ පළමු ආයතනික සැලසුම 2008 - 2012 කාල පරිච්ඡේදය සඳහා ආරම්භ කිරීම

2010

- ☑ විදුල්කා ප්‍රදර්ශනය, සම්මන්ත්‍රණය , ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මානය ආරම්භ කිරීම
- ☑ විදුලි උපකරණ සඳහා අනිවාර්ය බලශක්ති ලේබල් ප්‍රථම වරට හඳුන්වා දීම. - සංයුක්ත ප්‍රතිදීප්ත පහන් සඳහා
- ☑ පියැසි මත සූර්යය බල පද්ධති සඳහා ශුද්ධ මිනුම් ක්‍රමයක් ආරම්භ කිරීම

2011

- ☑ පාසල් බලශක්ති සමාජ හඳුන්වාදීම
- ☑ හම්බන්තොට ප්‍රදේශයේ ඉඳි කෙරුණු මෙගා වොට් 1.237ක ධාරිතාව ඇති ප්‍රථම සූර්ය බලාගාරය ජාතික පද්ධතියට සම්බන්ධ කිරීම

2014

- ☑ ශ්‍රී ලංකාවේ සූර්ය සම්පත් සිතියම ප්‍රකාශයට පත් කිරීම

2015

- ☑ ප්‍රතිපත්ති ඉලක්ක සපුරා ගනිමින් සමස්ත විදුලිය ජනනයෙන් 10%ක් නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් උත්පාදනය කර ගැනීම

2016

- ☑ පියැසි මත විදුලිය උත්පාදනය කිරීම වැඩි කරමින් සූර්ය බල සංග්‍රාමය වැඩසටහන ආරම්භ කිරීම, ශුද්ධ ගිණුම් ක්‍රමය ආරම්භ කිරීම.

2017

- ☑ වැඩසටහන් 10ක් සමඟින් ඉල්ලූම් පාර්ශ්වීය කළමනාකරණ මෙහෙයුම් පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය ස්ථාපනය කිරීම

2018

- ☑ සූර්ය බල සංග්‍රාමය වැඩ සටහන යටතේ ස්ථාපිත මෙගා වොට් 100 ඉලක්කය ළඟා කර ගැනීම.
- ☑ චික්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන / ආහාර හා කෘෂිකර්ම සංවිධානය /ගෝලීය පාරිසරික වැඩසටහන යන සංවිධාන මඟින් ක්‍රියාත්මක කරන ලද තිරසාර පෙව ස්කන්ධ බලශක්ති වැඩසටහන අතිශය සතුටුදායක මට්ටමකට නිම කිරීම.

2019

- ☑ ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පාර්ලිමේන්තුවේ සභාගත කිරීම
- ☑ නිවැසියන් සඳහා වූ තිරසාර බලශක්ති මාර්ගෝපදේශනය ප්‍රකාශයට පත් කිරීම
- ☑ ශ්‍රී ලංකාවේ පෙව ස්කන්ධ සම්පත් සිතියම ප්‍රකාශයට පත් කිරීම
- ☑ චික්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන / ආහාර හා කෘෂිකර්ම සංවිධානය /ගෝලීය පාරිසරික වැඩසටහන යන සංවිධානවලින් ක්‍රියාත්මක කෙරුණු බලශක්ති ක්ෂේත්‍රයේ කාබන් විමෝචන අඩු කිරීමේ ජාතික ව්‍යාපෘතිය අවසන් කිරීම

2020

- ☑ පුනර්ජනනීය ප්‍රභව මඟින් විදුලිය උත්පාදනය මෙගා වොට් පැය 1000 දක්වා ළඟා වීම
- ☑ පියැසි මත සූර්ය බල විදුලි උත්පාදන ධාරිතාව මෙගා වොට් 300 ඉක්මවා යෑම
- ☑ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීම
- ☑ විදුලි පංකා සහ ශීතකරණ සඳහා බලශක්ති ලේබලකරණ නියාමනයන් අවසන් කිරීම

2021

- ☑ පියැසි මත සූර්ය විදුලි පද්ධති 30 000කට අධික සංඛ්‍යාවකින් මෙගා වොට් 400ක ධාරිතාවක් ළඟා කර ගැනීම.
- ☑ යුරෝපා සංගමයේ සහය මත ශ්‍රී ලංකා පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආරම්භ කිරීම
- ☑ බලශක්ති කාර්යක්ෂම ගොඩනැඟිලි සඳහා වූ රීති සංග්‍රහය සංශෝධනය කර අවසන් කිරීම

2022

- ☑ **පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම 2022 - 2026 සම්පූර්ණ කිරීම**
- ☑ **පියැසි මත සූර්ය විදුලි උත්පාදනය කරන පද්ධති 45 000කින් මෙගා වොට් 600ක ධාරිතාවක් ළඟා කර ගැනීම.**
- ☑ **නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් මුළු විදුලි බල ජනනය සඳහා කෙරෙන දායකත්වය 18%ක් දක්වා ඉහළ නැංවීම**
- ☑ **වායු සම්කරණ යන්ත්‍ර පරීක්ෂා කිරීමේ පද්ධතිය ස්ථාපනය කිරීම**

කාර්ය සාධනයෙහිලා වැදගත් කරුණු

විස්තරය	ඒකකය	2021	2022
කාර්ය සාධනයෙහිලා වැදගත් කරුණු			
පුනර්ජනනීය විදුලි බල උත්පාදනය	GWh	8562	8301
කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව	MW	425	429
සූර්ය බලශක්ති ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව (භූමියට සවිකරන ලද)	MW	100.4	130
සුළං බලශක්ති ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව	MW	248.5	148
ජෛව ස්කන්ධ බලශක්ති ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව	MW	43.53	59
ජාතික පද්ධතියට සම්බන්ධ කර ඇති, පියැසි මත සූර්ය බල පද්ධති සමුච්චිත සංඛ්‍යාව සංඛ්‍යාව		36.64	46,203
පියැසි මත සූර්ය බල ව්‍යාපෘතිවල සමුච්චිත ධාරිතාව	MW	499	656.97
පියැසි මත සූර්ය බල ව්‍යාපෘතිවලින් කෙරෙන විදුලිය ජනනය	GWh	389	530
කාර්යක්ෂම උපකරණවලින් කෙරෙන විදුලිය ඉතිරිය	GWh	810	600
වළක්වන ලද කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය	මෙට්‍රික් ටොන්	6,512,603	
මානව ප්‍රාග්ධනය			
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මුළු සේවකයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	98	97
වසර 10ට වඩා සේවා පළපුරුද්ද ඇති සේවකයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	56	60
වසර 5ට වඩා සේවා පළපුරුද්ද ඇති සේවකයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	76	77
සමාජ සහසම්බන්ධතා ප්‍රාග්ධනය			
සිදු කරන ලද බලශක්ති විගණන සංඛ්‍යාව	සංඛ්‍යාව	3	5
බලශක්ති කළමනාකරුවන් සංඛ්‍යාව	සංඛ්‍යාව	234	238
කුළී පදනම මත උපකරණ-දින සංඛ්‍යාව	සංඛ්‍යාව	900	1140
ප්‍රකාශයට පත් කරන ලද බලශක්ති ලේඛලකරණ ප්‍රමිතීන් සංඛ්‍යාව	සංඛ්‍යාව		1
හම්බන්තොට සූර්ය උද්‍යානය නැරඹීමට පැමිණි සංඛ්‍යාව	සංඛ්‍යාව	51	
ලියාපදිංචි කරගන්නා ලද සූර්ය සේවා සමාගම් සංඛ්‍යාව	සංඛ්‍යාව	431	373
ලියාපදිංචි කරගන්නා ලද බලශක්ති සේවා සමාගම් සංඛ්‍යාව	සංඛ්‍යාව	29	29
බලශක්ති කළමනාකරණය පිළිබඳ පුහුණුව ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	80	110
සූර්ය ප්‍රකාශ විද්‍යුත් තාක්ෂණ පිළිබඳව පුහුණුව ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	580*	
ප්‍රකාශයට පත් කරන ලද සූර්ය බලශක්ති ප්‍රමිතීන් සංඛ්‍යාව	සංඛ්‍යාව	1	-
පහසුකම් සපයන ලද පර්යේෂණ සංඛ්‍යාව	සංඛ්‍යාව	1	-
පළ කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව	සංඛ්‍යාව	2	1

* ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම, ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සහ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය යන ආයතනවල සහයෝගීතාවයෙන් පුද්ගලයන් 3800ක් මෙයට අමතරව පුහුණුව ලබා ඇත.

ගිගා වොට් පැය 1,377

කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය



ගිගා වොට් පැය 723

සුළං බලාගාර ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය



ගිගා වොට් පැය 720

සූර්ය බලාගාර ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය





ගිගා වොට් පැය 117


ජෛව ස්කන්ධ ව්‍යාපෘතිවලින් කෙරෙන සමුච්චිත විදුලිය ජනනය



ජයග්‍රහණ


පුනර්ජනනීය බලශක්ති උත්පාදනය (ගිගා වොට් පැය)
7000
6000
5000
4000
3000
2000
1000
0
70%
60%
50%
40%
30%
20%
10%
0%
2007
2008
2009
2010
2011
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022
ප්‍රධාන ජල විදුලි බලාගාරවලින් (ගිගා වොට් පැය)
නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් (ගිගා වොට් පැය)
පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය (%)


පුනර්ජනනීය බලශක්ති ධාරිතා චිකතුව (මෙගා වොට්)
1,600
1,400
1,200
1,000
800
600
400
200
0
2007
2008
2009
2010
2011
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022
ජල විදුලිය
සූර්යයන බලය
පියැසි මත සූර්ය විදුලි පද්ධත
ජෛව ස්කන්ධය
සුළං බලය
මුළු නව පුනර්ජනනී බලශක්ති ප්‍රමාණය (මෙගා වොට්)


නව පුනර්ජනනී බලශක්ති ධාරිතා චිකතුව (මෙගා වොට්)
1,600
1,400
1,200
1,000
800
600
400
200
0
2007
2008
2009
2010
2011
2012
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022





සභාපතිතුමාගේ පණිවුඩය

“ තිරසාර බලශක්තිය සඳහා රජයේ අඛණ්ඩ කැපවීම ”

රටේ විදේශ විනිමය සංචිත ප්‍රමාණය පහළ වැටීමත් සමඟ බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීමේ දුෂ්කරතාවන්ට ශ්‍රී ලංකාව පසුගිය කාලයේදී මුහුණ දුන්නේ ය. එම දුෂ්කරතාවයෙන් මිදීමට, අද ගනු ලබන සෑම පියවරක් ම, රටේ ආර්ථික තිරසාරභාවයට විශාල දායකත්වයක් සපයන බව පුළුල්ව විද්‍යමාන වේ. මෙකී පසුබිම තුළ, තිරසාර බලශක්ති මැදිහත්වීම්වල වැදගත්කම, සාමාන්‍ය සන්දර්භයෙහිදී ඒවායේ පැවැත්මට වඩා බෙහෙවින් වැදගත් බව පෙනී යයි. 2022 වර්ෂයේදී තිරසාර බලශක්ති සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද්දේ මෙම පුළුල් විෂය පථයෙහි බව මම දකිමි. තිරසාර බලශක්ති ක්ෂේත්‍රය වෙනුවෙන් රජය අඛණ්ඩව කැප වී ක්‍රියා කරමින් සිටියි. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාව සම්බන්ධ වී ඇති අන්තර්ජාතික ගිවිසුම් සහිත පසුබිමක එම විෂය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා ගැඹුරු වේදිකාවක් නිර්මාණය කිරීමට රජය සහාය ලබාදෙයි. 2030 වසර වනවිට විදුලි ජනනයෙන් 70%ක් පුනර්ජනනී බලශක්ති ප්‍රභවයන්ගෙන් උත්පාදනය කිරීම රජයේ ප්‍රතිපත්තියයි. ඒ සම්බන්ධයෙන් දැඩි සංවාදයක් ඇති වී තිබේ. ක්‍රියාකාරකම් විධිමත්ව කරගෙන යෑම සඳහා බොහෝ පාර්ශ්වකරුවන් තම දායකත්වයේ වැදගත්කම අවබෝධ කරගෙන ඇති බව ද නිරීක්ෂණය කළ හැකි විණ. එකී පසුබිම අපගේ වැඩසටහන්වලට ශක්තියක් වී තිබේ. සැපයුම් පාර්ශ්ව කළමනාකරණය සහ ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය යන දෙඅංශයෙහි ම ක්‍රියාකාරකම් ලබා ඇති සැලකිය යුතු ප්‍රගතිය අගය කරන අතර සියලු ම පාර්ශ්වකරුවන්ටත්, මෙම ප්‍රතිදානය සඳහා කැප වී දායකත්වය ලබාදුන් මගේ කාර්යය මණ්ඩලයටත් ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිවල, සංවර්ධන ක්‍රියාකාරකම් ජයග්‍රහණ ගැන මම වෙසෙසින් සඳහන් කරමි. ඒ, පෞද්ගලික අංශය එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පළමුව, මූලික ව්‍යාපෘති සංවර්ධන කටයුතු රජය විසින් සිදු කරන ලද බැවිනි.

මේ ආකාරයේ පළමු ව්‍යාපෘතිය වන්නේ සියඹලාණ්ඩුව මෙගා වොට් 100ක ධාරිතාවයෙන් යුත් සූර්ය බල ව්‍යාපෘතියයි. එම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සංවර්ධකයකු තෝරාගෙන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට සම්බන්ධ වීමට හැකි විණ. එකී ව්‍යාපෘතිය මේ වසර තුළදී සාර්ථක සන්ධිස්ථානයක් කරා ළඟා වූයේ ය. තව ද, මිළඟ බලශක්ති උද්‍යාන ව්‍යාපෘතිය වන මන්නාරම දෙවන අදියර සහ පුනර්ජනනී සුළං විදුලි ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙමින් පවතී. එම ව්‍යාපෘති සඳහා රජය ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී තිබිණ. ඉඩම් ලබාගැනීමේදී සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි මැදිහත් වීම ඉතා වැදගත් බව සටහන් විය. මෙම ක්‍රියාවලීන්හිදී පාර්ශ්වකාර ආයතනවලින් ලැබෙන සහයෝගය ද කැපී පෙනෙයි. ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනවලින් සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ගෙන් අඛණ්ඩව ම ලැබෙන සහයෝගය විශාල උපකාරයක් වනු ඇත.

විශේෂයෙන් ම නව ප්‍රාණයක් ලබන ගෝලීය බලශක්ති සංක්‍රමණ සන්දර්භය තුළ ද, පුළුල් තාක්ෂණික දියුණුව සමඟ ද, තිරසාර බලශක්ති විෂය සම්බන්ධයෙන් තවදුරටත් වැඩිවන ගෝලීය ප්‍රවණතා පිළිබඳව අවබෝධ කරගැනීම කාලෝචිත ය. ජාතියක් වශයෙන් ගෝලීය සැලසුම් සමඟ සමගාමීව යෑමට නම් තවදුරටත් කැපවීම අවශ්‍ය බව නිරීක්ෂණය කළ හැකි ය. ඒ සඳහා අන්තර්ජාතික මූල්‍ය සහයෝගිතා ආයතනවල සහාය තවදුරටත් වැදගත් වේ. මෙලෙස තිරසාර බලශක්තිය සඳහා ගැඹුරු වේදිකාවක් නිර්මාණය වෙමින් වඩ වඩාත් ශක්තිමත් වෙමින් පවතී. එය අපගේ ඒකායන අපේක්ෂාව ද වේ. තිරසාර ප්‍රභව මඟින් කෙරෙන දිගු කාලීන සුරක්ෂිත බලශක්ති සැපයුමකින් පුළුල් ආර්ථික ගැටළු සඳහා ගැඹුරු විසඳුමක් ලැබෙනු ඇත.



ඉංජිනේරු රංජිත් සේපාල
සභාපති
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය



අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය

“තිරසාර සහ බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්”

2050 වසර වනවිට බලශක්ති ක්ෂේත්‍රයේ කාබන් උදාසීනත්ව තත්ත්වය සපුරා ගැනීමට ද, 2030 වසර වනවිට සමස්ත විදුලි ජනනයෙන් 70%ක් තිරසාර බලශක්ති ප්‍රභවවලින් උත්පාදනය කර ගැනීමට ද ඉලක්ක කෙරෙන බැවින් ශක්තිමත් පුනර්ජනනීය බලශක්ති පදනමක් රටෙහි නිර්මාණය කර ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය වී ඇත.

පියැසි මත ඉඳි කෙරෙන සූර්ය විදුලි පද්ධතිවල සිට මහා පරිමාණයේ පුනර්ජනනීය බලශක්ති උද්‍යාන දක්වා වූ පුළුල් පරාසයක පැතිරුණු බලශක්ති වැඩසටහන් 2022 වසරේදී ක්‍රියාත්මක කෙරිණ. පියැසි මත ඉඳි කෙරුණු සූර්ය විදුලි පද්ධති මඟින් සැලකිය යුතු විදුලිය ප්‍රමාණයක් උත්පාදනය කෙරේ. දිවා කාලයේ විදුලි ඉල්ලුම අඩු කරගැනීමට එයින් දායකත්වය සැපයේ. රාත්‍රියේදී උපරිමයකට ළඟා වන විදුලි ඉල්ලුම සපුරා ගැනීම සඳහා ජල විදුලි බලය සංරක්ෂණය කර ගැනීමට එමඟින් ඉඩ සැලසී ඇත.

ඒ සියල්ලට ම වඩා වැදගත් වන්නේ එම වැඩසටහන සමස්ථ ආර්ථිකය ඉහළ නැංවීමට දායක වෙමින් රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් නිර්මාණය කිරීමේ මාර්ගයක් බවට පත්වීම ය. මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වන මෙගා වොට් 100ක ධාරිතාවයෙන් යුත් සියඹලාණ්ඩුව සූර්ය බල ව්‍යාපෘතිය, මන්නාරම දෙවන අදියර සුළං බල ව්‍යාපෘතිය සහ පුනර්න් සුළං බල ව්‍යාපෘතිය ඉදිරි වසර දෙක ඇතුළත ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන තිබේ. නව තාක්ෂණික මැදිහත්වීම් ලෙස මුහුදාශ්‍රිත සුළං බලාගාර සහ පාවෙන සූර්ය බලාගාර ඉඳි කිරීම සම්බන්ධයෙන් ද වැඩි අවධානය යොමුව ඇත. පුනර්ජනනීය බලශක්ති භාවිතය මේ අන්දමට විධිමත් කරන අතර බලශක්ති කාර්යක්ෂමතාව පළමු ඉන්ධනය බව අපි හොඳින් ම අවබෝධ කරගෙන සිටින්නෙමු.

බලශක්ති සංරක්ෂණය සඳහා ශක්තිමත් ජාතික පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ද අපගේ වැඩසටහන් ඒකාබද්ධ කර ඇත. ඒ අනුව බලශක්ති කාර්යක්ෂම ගොඩනැඟිලි සඳහා කාර්යය සංග්‍රහයක් සැකසීම, බලශක්ති ලේබල්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ බලශක්ති භාවිතය සඳහා මිනුම් සලකුණු ඉදිරිපත් කිරීම හා ඒ ආශ්‍රිත පහසුකම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබේ. බලශක්ති සංරක්ෂණ සංස්කෘතියක් සමාජයේ විවිධ ස්ථරවල ඇති කිරීම සඳහා අඛණ්ඩව අවධානය යොමු කර ඇත.

”තිරසාර සහ බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්” බිහි කිරීම සඳහා දරන ප්‍රයත්නයේදී ඊට සම්බන්ධ පාර්ශ්ව ආයතනවලට, මූල්‍ය සහයෝගිතා ආයතනවලට, පෞද්ගලික අංශයට සහ මෙම වැඩසටහන්වලට ඉමහත් දායකත්වයක් ලබා දෙන සියලුදෙනාට මම බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.



ඉංජිනේරු ජේ.එම්. අතුල
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය



කළමනාකරණ මණ්ඩලය

ඉංජිනේරු රංජිත් සේපාල
සභාපති
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

හේමන්ත සමරකෝන් මහතා
ලේකම්
සූර්යා, සුළං සහ ජල විදුලිබල සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

නයනා නාතවිතාරණ මහත්මිය
අතිරේක ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
(2022 වසරේ ජනවාරි - මාර්තු)

කේ.ඒ.එස්. මහේෂිකා මහත්මිය
අතිරේක ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
(2022 මාර්තු සිට)

පී. නාමගල් මහත්මිය
අධ්‍යක්ෂ
කර්මාන්ත අමාත්‍යාංශය

ඊ.ඒ. ආර්. රේණුකා මහත්මිය
අතිරේක ලේකම් (සංවර්ධන)
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

අංජලිකා කේ. ගුණසේකර මහත්මිය
අධ්‍යක්ෂ
ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල්, ආර්ථික සහ
ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය
(2022 වසරේ ජනවාරි - පෙබරවාරි)

එන්.එම්.එස්. පී. කරුණාදාස මහතා
සහකාර අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
(2022 වසරේ පෙබරවාරි සිට)

ලතීෂා ලියනගේ මහත්මිය
අතිරේක ලේකම් (පරිපාලන සහ මානව සම්පත් සංවර්ධන,)
මහවැලි කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

දමිත් කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජෙනරාල්
මහජන උපයෝගීතා කොමිසම

චන්ද්‍රරත්න විතානගේ මහතා
ජ්‍යේෂ්ඨ සහකාර මහ ලේකම්
ලංකා වාණිජ මණ්ඩලය

ඩබ්ලිව්.ජේ. ඩබ්ලිව්. එස්. ප්‍රනාන්දු මහතා
පත්කළ සාමාජික

රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා
ලේකම්,
වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

කුලානි එච්. ඩබ්ලිව්. කරුණාරත්න මහත්මිය
අධ්‍යක්ෂ (විමර්ශන)
පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

ඒ.එම්. ආර්.ජේ.කේ. ජයසිංහ මහතා
ලේකම්
ප්‍රවාහන අමාත්‍යාංශය
(2022 වසරේ ජනවාරි - අප්‍රේල්)

එන්.බී.එම් රණතුංග මහතා
ලේකම්
ප්‍රවාහන අමාත්‍යාංශය (2022 වසරේ අප්‍රේල් සිට)

රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා
පත්කළ සාමාජික
(2022 වසරේ ජනවාරි - ඔක්තෝබර්)

ෆාහිම් අලවිඩීන් මහතා
පත්කළ සාමාජික
(2022 වසරේ ජනවාරි - ඔක්තෝබර්)

ලක්මාල් තුෂාර ප්‍රනාන්දු මහතා
පත්කළ සාමාජික
(2022 වසරේ ජනවාරි - ඔක්තෝබර්)

ධම්මික පීරිස් මහතා
පත්කළ සාමාජික
(2022 වසරේ ජනවාරි - ඔක්තෝබර්)

ඉංජිනේරු කුෂාන් ජයසූරිය මහතා
පත්කළ සාමාජික
(2022 වසරේ ඔක්තෝබර් සිට)

දිලාන් විදානපතිරණ මහතා
පත්කළ සාමාජික
(2022 වසරේ ඔක්තෝබර් සිට)

මනිල් මුදලිගේ මහතා
පත්කළ සාමාජික
(2022 වසරේ ඔක්තෝබර් සිට)

අජිත් දමුණුපොළ මහතා
පත්කළ සාමාජික
(2022 ඔක්තෝබර් සිට)

ආර්.එල්. මොළගොඩ මහතා
අධ්‍යක්ෂ (තාක්ෂණ)
ප්‍රවාහන සහ මහා මාර්ග අමාත්‍යාංශය
(2022 වසරේ අගෝස්තු සිට)

විගණන සහ කළමනාකරණ කමිටුව

සාමාජිකයන්

එන්.එම්.එස්.පී. කරුණාදාස මහතා
සහකාර අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය

පී. නාමගල් මහත්මිය,
අධ්‍යක්ෂ,
කර්මාන්ත අමාත්‍යාංශය

ෆාහිම් අලව්ඩීන් මහතා,
කළමනාකරණ මණ්ඩල සාමාජික,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

අජිත් දමුණුපොළ මහතා,
කළමනාකරණ මණ්ඩල සාමාජික,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

නිරීක්ෂකයන්

එන්.ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මිය,
විගණන අධිකාරී,
ජාතික විගණන කාර්යාලය

එම්.පී. කන්දීබන් මහතා,
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය.





ආයතනික පාලනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය සමානත්වය, සාධාරණත්වය, අපක්ෂපාතීත්වය, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම පහ ගුරු කරගෙන ක්‍රියාත්මක වේ. මෙම පාලන මූලධර්ම පදනම ලෙස තබා ගනිමින් සියලුම පාර්ශ්වකරුවන් සමඟ සවිමත් සබඳතා ගොඩනඟා ගැනීමට ද, තිරසාර බලශක්ති සංවර්ධනය උදෙසා හිතකර පරිසරයක් පෝෂණය කිරීමට ද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය උත්සාහ ගනිමින් සිටියි. රජයේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය උදෙසා ආචාර ධර්ම ප්‍රමිතීන්ට අනුගත වෙමින් අධිකාරියෙහි කටයුතු ක්‍රියාත්මක කෙරේ. රජය විසින් ප්‍රකාශිත ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යුහයන් සහ තොරතුරු පෙළ ගැස්වීමට අධිකාරිය කැප වී නිවැරදිව ක්‍රියා කරයි.

කළමනාකරණ මණ්ඩලය

2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත ප්‍රකාරව පවරා ඇති රාජකාරී ඉටුකිරීම සම්බන්ධයෙන් අවසන් වගාකීම දරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලය විසිනි. විෂය භාර අමාත්‍යවරයා පත් කළ සභාපතිවරයා ඊට නායකත්වය ලබා දෙයි.

වගකීම

පනතේ දක්වා ඇති අරමුණු සපුරාලීම, පනතෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සහ සපයා ඇති මූල්‍ය තොරතුරුවල නිරවද්‍යභාවය උදෙසා අභ්‍යන්තර පාලන පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවසන් වගකීම දරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලය විසිනි.

අධිකාරියෙහි කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රියාත්මක කරන අතර කළමනාකරණ මණ්ඩලයේ පාලනයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරයි.

අධිකාරියේ මූල්‍ය අංශයේ කටයුතු අධීක්ෂණය කරන විගණන සහ කළමනාකරණ කමිටුව නම් වූ අනුකමිටුවක් මඟින් මණ්ඩලයට සහාය සැපයේ. එමෙන් ම මණ්ඩලයේ හැකියාවෙන් ඔබ්බෙහි පවතින, තාක්ෂණික වශයෙන් සංකීර්ණ වූ කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අවශ්‍යතාව මතු වූ විට බාහිර උපදේශක කමිටුවක සහාය, මණ්ඩලයට ලැබෙයි.

අධිකාරියේ සියලු ම ප්‍රසම්පාදන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට දැඩි ලෙස යටත්ව සිදු කරනු ලැබේ. බලාපොරොත්තු වන ප්‍රසම්පාදනයේ වටිනාකම මත ස්වාධීන තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු දෙකක මඟපෙන්වීම යටතේ එකී කාර්යය අධිකාරියේ නිලධාරීහු සපුරති.

සංයුතිය

නිල බලයෙන් පත්වන සාමාජිකයන් දොළොස්දෙනෙකුගෙන් ද, සභාපතිවරයා ඇතුළුව පත් කරගන්නා ලද සාමාජිකයන් නවදෙනෙකුගෙන් ද වශයෙන් මණ්ඩලය සාමාජිකයන් විසි එක්දෙනෙකුගෙන් සමන්විත ය.

කළමනාකරණ මණ්ඩල රැස්වීම්

දින දර්ශනය මත පදනම්ව මණ්ඩල රැස්වීම් සැලසුම් කෙරෙන අතර අවම වශයෙන් මසකට එක රැස්වීමක්වත් පැවැත් වේ. අධිකාරියේ උපාය මාර්ගික දිශානතිය සකස් කිරීම, සියලුම ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය සහ ප්‍රගතිය සමාලෝචනය කිරීම, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සමාලෝචනය, වැඩසටහන් සැකසීම යන කාර්යයන් මෙකී රැස්වීම්වලදී සිදු කෙරේ.

අධිකාරියේ නිලධාරීන්ට, අධිකාරියේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අදාළ වන යෝජනා, මණ්ඩලයේ අවධානයට යොමු කිරීම සඳහා ඉදිරිපත් කිරීමට මෙම රැස්වීම්වලදී ඉඩ ලැබෙයි. සෑම රැස්වීමකට ම පළමුව කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ට ප්‍රමාණවත් තරම් ලේඛන ලබාදීමට පියවර ගැනේ.

2022 වර්ෂයේ පැවැති රැස්වීම් සඳහා කළමනාකරණ මණ්ඩලයේ සහභාගීත්වය පහත දැක් වේ.

රැස්වීම් අංකය	රැස් වූ දිනය	සහභාගි වූ සංඛ්‍යාව
1	20.01.2022	15
2	24.02.2022	15
3	07.04.2022	14
4	19.05.2022	08
5	30.06.2022	09
6	10.08.2022	14
7	27.10.2022	10
8	08.10.2022	10
9	28.12.2022	12

නෛතික අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීම

අධිකාරිය ස්ථාපනය කරන ලද පනතේ විධිවිධාන සහ රජය මඟින් වරින් වර පනවනු ලබන නීති, රෙගුලාසි හා මාර්ගෝපදේශනයන්ට අනුකූලතාව දක්වන බව සහතික කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය සෑම උත්සාහයක් ම දරයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට ද 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට ද අනුකූලව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශය සකස් කෙරෙන බව මණ්ඩලය මඟින් සහතික කෙරේ.

අවදානම් කළමනාකරණය

යහ කළමනාකරණයේදී සහ පාලනයේදී අවදානම් කළමනාකරණය අවශ්‍ය ම අංගයක් බව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අවබෝධ කරගෙන ඇති අතර තිරසාර බලශක්තියට අදාළ වන පොදු අවදානම් ද අතිරේක අවදානම් ද එම අධිකාරිය හඳුනාගෙන ඇත. එම විශේෂ අවදානම් ප්‍රධාන වශයෙන් සම්බන්ධ වන්නේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා එය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්තිමය පරිසරය සමඟ ය. එබැවින් මූල්‍ය සහ මෙහෙයුම් පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් කළමනාකරණ මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය සමඟ එක්ව අවදානම් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. අභ්‍යන්තර විගණන සහ කළමනාකරණ කණ්ඩායමක් අධිකාරියේ පද්ධතිවල කාර්ය සාධනය විටින් විට සමාලෝචනය කරයි.

අවදානම් සංස්කෘතිය

අවදානම් තත්ත්වය කළමනාකරණ මණ්ඩලයේ පැහැදිලි අවධානයට ලක්ව ඇති අතර අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් විශේෂ වැඩපිළිවෙලක් පවත්වාගෙන යනු ලැබේ. ආචාර ධර්ම මූලධර්ම වෙත ඇති ස්වකීය කැපවීම පිළිබිඹු කරමින් කළමනාකාරීත්වය තීරණ ගැනීමේදී සියලුම පාර්ශවකරුවන්ගේ තත්ත්වය සැලකිල්ලට ගනු ලැබේ. නායකත්වයට අනුව, කාර්ය මණ්ඩලය ද එවැනි සදාචාරාත්මක මූලධර්මවල වැදගත්කම හඳුනාගෙන එය අඛණ්ඩව අනුගමනය කරයි.

අවදානම් හඳුනාගැනීම

අවදානම් හඳුනාගැනීමේදී අධිකාරිය බාහිර පරිසරය සමීපව නිරීක්ෂණය කරයි. ඒ අනුව හඳුනාගන්නා අවදානම්, ගෝලීය බලශක්ති කර්මාන්තයට සහ මෙරටට සුවිශේෂී වන ආකාරය අනුව ඒවා වර්ග කිරීමට ද අධිකාරිය කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීමට අධිකාරිය 2019 වසරේදී දායකත්වය ලබා දෙන අතර අධිකාරිය එහි වැඩසටහන්වලට ප්‍රතිපත්තිමය පසුබිමට සාධනීය වන ලෙස ප්‍රකාශිත ප්‍රතිපත්තියට එකඟ වන වැඩසටහන් හඳුනාගෙන තිබේ.

අවදානම් කළමනාකරණය

පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සහ බලශක්ති හානිය අවම කිරීම අධිකාරිය මූලික ක්ෂේත්‍ර ලෙස සලකයි. පොසිල ඉන්ධන මිල අඩුවීමේ ප්‍රධාන අවදානම් හඳුනාගැනීමට ද පියවර ගැනේ. මෙය පුනර්ජනනීය බලශක්තිය වෙනුවට ඇති ඉතා ලාභ විකල්පයක් බවට පත්වීමේ අවදානමක් ඇති අතර භාවිතා කරන්නන් අතින් බලශක්තිය අපතේ යෑමට ද එය හේතු විය හැකි ය.

ඒ අනුව පොසිල ඉන්ධන මිල පහළ මට්ටමක පවතින තත්ත්වයක වුවද තිරසාර බලශක්ති සේවාවන්ට ඇති ඉල්ලුම අහිමි නොවන පරිදි අවම පිරිවැය තත්වයක් දක්වා තිරසාර බලශක්ති වෙළඳපොළ පරිවර්තනය කිරීමේ අරමුණෙන් අවදානම් කළමනාකරණ ක්‍රමෝපායක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අනුගමනය කරනු ලැබේ.

සැලකිය යුතු ධාරිතාවක් එකතු කරගැනීම සඳහා ප්‍රවේශයන් කිහිපයකින් පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල සහාය ලබාදෙයි. පියැසි මත සූර්ය පැනල ඉඳි කිරීමේ කර්මාන්තයේ තරගකාරීත්වය දිරිගැන්වීම සඳහා නව සමාගම් විශාල සංඛ්‍යාවකට සේවා සම්පාදකයන් ලෙස එකතුවීමට අවස්ථාව සලසමින් සූර්ය බලශක්ති කර්මාන්තය පෝෂණය කරන ලදී. සූර්යාලෝකයෙන් විදුලිය උත්පාදනය කරගැනීමේ මිල තරගකාරී තත්ත්වයකට පත් කර ගැනීමට එය ඉවහල් විණ. ඒ හා සමානවම, බලශක්ති සේවා සපයන සමාගම් පෝෂණය කෙරිණි ඒවාට සහාය ලබාදෙන ලදී. විදුලිය සහ පොසිල ඉන්ධනවල මිල පහළ මට්ටමක පැවැතිය ද මෙම සමාගම්වලට, කර්මාන්තයට සහ ආර්ථිකයට බලශක්ති කාර්යක්ෂමතා සේවා සැපයුම අඛණ්ඩව ම සිදුකළ හැකිව තිබේ.

පාරිභෝගික බදු සහ උත්පාදන පිරිවැය වැඩිවීම නිසා විදුලිය කර්මාන්තයට සැලකිය යුතු අලාභයක් සිදුවෙමින් පවතින අතර එය මුදල් ප්‍රවාහයෙහි අර්බුධයක් ඇති කිරීමට ද හේතුවක් වී ඇත. පුනර්ජනනීය බලශක්ති කර්මාන්තයට මෙම වර්ධනයන් අහිතකර ලෙස බලපාන අතර එමඟින් කර්මාන්තයට අත් කවරදාකටත් වඩා සැලකිය යුතු තරමේ අවදානකමට මුහුණ දීමට සිදු වේ.

සම්පත් අහිමි වීමේ අවදානම

රටෙහි අගනා පුනර්ජනනීය බලශක්ති සම්පත්වලට, ඉඩම් පරිහරණය කිරීමේ රටාව වෙනස්වීම සහ මානව ක්‍රියාකාරකම් අහිතකර අන්දමෙන් බලපා තිබේ. ජනාවාස ව්‍යාප්තවීම හේතුවෙන් ඵලදායී සුළං බලශක්ති සම්පත අනූන බිම් විශාල ප්‍රමාණයක් අහිමි වී ඇත. වන විනාශය හේතුවෙන් ගංගාවල ජල පෝෂක ප්‍රදේශවලට අයහපත් බලපෑම් එල්ල වී තිබේ. අතීතයේ විශිෂ්ට ජල ප්‍රවාහ බව පෙන්නුම් කළ ද ජල විදුලි බල සම්පත් අක්‍රමවත් බවක් පෙන්නුම් කරන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. දේශගුණික විපර්යාසවල සෘජු ප්‍රතිඵල නිසා වාණිජ වගාවන් ව්‍යාප්ත වීමත්, වර්ෂාපතන රටාවන් වෙනස්වීමත් එම අක්‍රමවත් බවට තවදුරටත් හේතු වී ඇත. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට එරෙහිව සිවිල් සමාජ සංවිධාන ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග වැඩිවීම ද මෙම ස්වභාවික හේතූන් සමඟ මිශ්‍ර වී තිබේ. 2022 වසරේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වගඋත්තරකරුවකු බව දක්වමින් නඩු 4ක් ගොනු කර තිබිණ. ඵලදායී පුනර්ජනනීය බලශක්ති සම්පත් දැඩි ලෙස අහිමි වී යෑමට එවැනි පියවර හේතු වී ඇත.


බලශක්ති සේවාවන්හි මිල පහළ මට්ටමක පැවතීමේ අවදානම

විදුලිය මිල 2014 වසරේදී 25%කින් අඩු කරන ලද අතර එය බල ශක්ති සේවා කර්මාන්තයට බලපෑවේ ය. කර්මාන්ත අංශය සඳහා ද දිවා කාලයේදී ඉතා අඩු බදු පනවමින් නිෂ්පාදන පිරිවැය අඩු කරන ලදී. මේ නිසා බලශක්ති නාස්තිය අඩු කිරීමට ඇති උනන්දුව හීන වී ගියේ ය. බලශක්ති සේවා අංශයේ සැලකිය යුතු වෙළඳ පොළ හැකිලීමකට එය හේතු විය. කාර්මික තාපන අවශ්‍යතා සඳහා පොසිල ඉන්ධන යොදා ගැනීම අඩු මට්ටමක පැවතීම නිසා ද මෙකී ගැටලුව ඉස්මතු විණ. එසේ වුවද ආයතනික පරිශීලකයෝ සීමිත පිරිසක්, මහා පරිමාණයෙන් බලශක්ති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිවල නිරත වෙමින් කාබන් විමෝචනය අවම කරගැනීමටත් මෙහෙයුම් පිරිවැය අඩු කරගැනීමටත් සමත් වූහ. එමඟින් සැලකිය යුතු ප්‍රතිලාභ ලබා ගනිමින් ඔවුහු තිරසාර ඉලක්ක හඹා ගියහ.

අවදානම් නිරීක්ෂණය සහ සමාලෝචනය

අධිකාරියේ අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් පවතින්නේ ද යන්න සහ ඒවායෙහි ක්‍රියාකාරීත්වය කාලීන සමාලෝචනයකට ලක් කෙරෙන අතර අදාළ පාලන යාන්ත්‍රණයන්හි දුර්වලතා හඳුනාගෙන අවශ්‍ය අභ්‍යන්තර සහ බාහිර වෙනස්කම් සිදු කිරීම එහි අරමුණයි. සිදු කෙරෙමින් පවතින අධීක්ෂණ කටයුතුවල හෝ වෙනම සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල අඟැයීම් කටයුතු හෝ සම්බන්ධයෙන් අවසන් වගකීම දරන්නේ ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය සහ විගණන හා කළමනාකරණ කමිටුව ය. අධිකාරියෙහි විවිධ සේවා සැපයුම් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් පද්ධති පාදක විගණන කටයුතු සිදු කිරීමේ කාර්යය අභ්‍යන්තර විගණනක සිදු කරයි. අධිකාරියෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වාර්ෂිකව සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබේ.

සංවිධානයේ ව්‍යුහය


සභාපති සහ
කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(සැපයුම් පාර්ශ්වීය කළමනාකරණය)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(සැපයුම් පාර්ශ්වීය කළමනාකරණය)
අධ්‍යක්ෂ
(පරිපාලන හා මානව
සම්පත් කළමනාකරණය)
අධ්‍යක්ෂ (පර්යේෂණ සහ සංවර්ධන)
අධ්‍යක්ෂ (ප්‍රභව අනුරූප)
අධ්‍යක්ෂ (ප්‍රභව සංවර්ධන සහ පහසුකම් සැලසීම)
අධ්‍යක්ෂ (ප්‍රතිජනනීය බලශක්ති සේවා)
අධ්‍යක්ෂ (POA)
අධ්‍යක්ෂ (ONP)
අධ්‍යක්ෂ (IMS)
අධ්‍යක්ෂ (RMB)
අධ්‍යක්ෂ (කර්මාන්ත සේවා අංශය)
අධ්‍යක්ෂ (ගෘහස්ත, කෘෂි සහ කුඩා හා මධ්‍ය පරිමාණ
ව්‍යවසායක)
අධ්‍යක්ෂ (පද්ධති හා සැලසුම් තොරතුරු සහ කළමනාකරණ)
අධ්‍යක්ෂ (සමීක්ෂණ සහ පර්යේෂණ)
අධ්‍යක්ෂ
(මූල්‍ය)
නියෝජ්‍ය අධ්‍යක්ෂවරු / සහකාර අධ්‍යක්ෂකවරු
කනිෂ්ඨ කළමනාකරුවන් (කාර්මික / කාර්මික නොවන)
කළමනාකරණ සහයකයන් (කාර්මික / කාර්මික නොවන)
ක්ෂේත්‍ර සහායකයන් (රියදුරන්)/කාර්යාලීය කාර්යය සහායකයන්/කම්කරුවන්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රධාන අංශ

වැඩසටහන්, අංශ එකොළහක් යටතේ ක්‍රියාත්මක කෙරේ. මූල්‍ය, තොරතුරු කළමනාකරණ සහ පරිපාලන හා මානව සම්පත් යන තවත් අංශ තුනක සහාය ද ඊට ලැබෙයි.


අංශය	අරමුණ
පර්යේෂණ හා සංවර්ධන	තිරසාර බලශක්ති තාක්ෂණ සංවර්ධනය සහ ජාතික පරිමාණයේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
අරමුදල් සම්පාදනය	සංවර්ධන හවුල්කරුවන් සහ අරමුදල් සපයන්නන් සමඟ සම්බන්ධ වී තිරසාර බලශක්ති ව්‍යාපාර සඳහා ආයෝජන සහ ණය ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම
ප්‍රභව අනුරූප	සියලුම පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සම්බන්ධ ගවේෂණය, තක්සේරු කිරීම සහ පිහිටි භූමි හඳුනාගැනීම
ප්‍රභව සංවර්ධනය සහ පහසුකම් සැපයීම	ව්‍යාපෘති සංවර්ධකයින් සහ අදාළ ව්‍යවස්ථාපිත ආයතන සමඟ සම්බන්ධ වී පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
පුනර්ජනනීය බලශක්ති සේවා	කුඩා පරිමාණ විදුලි උත්පාදන ඒකක විශාල සංඛ්‍යාවක ව්‍යවසායකයින් සහ සේවා සපයන්නන් සම්බන්ධ කර ගැනීම
සමීක්ෂණ සහ පර්යේෂණ	තිරසාර බලශක්ති සංවර්ධනයට අදාළ ක්ෂේත්‍ර විමර්ශන සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම
පද්ධති සහ සැලසුම්	මහා පරිමාණ වෙළෙඳපොළ පරිවර්තනයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික පරිමාණ මැදිහත්වීම් සහ ඒකාබද්ධ යෝජනා ක්‍රම සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
කර්මාන්ත සහ සේවා අංශය	මහා පරිමාණ බලශක්ති පරිශීලක ක්ෂේත්‍රවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ගෘහ, කෘෂිකර්ම, සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ	උපකරණ බලශක්ති කාර්යක්ෂමතා වැඩසටහන ඇතුළුව කුඩා පරිමාණ බලශක්ති පරිශීලකයන්ගේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ප්‍රතිපත්ති උපදේශනය	ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපාය මාර්ග විශ්ලේෂණය සහ සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා බලශක්ති තුලනය සම්පාදනය කිරීම ඇතුළුව ජාතික බලශක්ති තොරතුරු කළමනාකරණය කිරීම
ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය	රටේ ක්‍රියාත්මක කර ඇති තිරසාර බලශක්ති වැඩසටහන් සඳහා සියලුම පුරවැසියන් සහ බලශක්ති භාවිත කරන්නන් සම්බන්ධ කර ගැනීම
පරිපාලන අංශය	සියලුම පරිපාලන කටයුතු, මානව සම්පත් කළමනාකරණය සහ උපකාරක සේවා විචක්ෂණශීලීව ක්‍රියා කරමින් අධිකාරියේ මූල්‍යයේ අංශයේ සියලු කටයුතු පාලනය කිරීම
මූල්‍ය අංශය	විචක්ෂණශීලීව ක්‍රියා කරමින් අධිකාරියේ මූල්‍යයේ අංශයේ සියලු කටයුතු පාලනය කිරීම

කාර්යය මණ්ඩල තොරතුරු


ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ
සේවකයන් සංඛ්‍යාව සහ තනතුරුවල තත්ත්වය 2022.12.31

නිල නාමය / තනතුර	වැටුප් කේතය	මට්ටම	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ මුළු තනතුරු ගණන	තනතුරුවල සිටින මුළු සංඛ්‍යාව	පුරප්පාඩු වී ඇති මුළු තනතුරු ගණන
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්					
අධ්‍යක්ෂ ජනරාල්	HM2-3	ජ්‍යෙෂ්ඨ	01	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	HM2-1	ජ්‍යෙෂ්ඨ	02	02	-
අධ්‍යක්ෂ	HM1-1	ජ්‍යෙෂ්ඨ	14	11	03
මධ්‍යම කළමනාකරුවන්					
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂක	MM1-1	ජ්‍යෙෂ්ඨ	48	27	21
කණිෂ්ඨ කළමනාකරුවන්					
විගණන නිලධාරී 01/ සංඛ්‍යාන නිලධාරී 01/ ප්‍රසම්පාදන නිලධාරී 01/ පරිපාලන නිලධාරී 01/ මූල්‍ය නිලධාරී 01/ ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී 01/ GIS නිලධාරී 02/ ඉඩම් අත්පත් කරගැනීමේ නිලධාරී 01/ මාධ්‍ය නිලධාරී 01/ පර්යේෂණ සහ අනුරූප නිලධාරී 01	JM 1-2	තෘතීක	11	09	02
කළමනාකරණ සහකරුවන් - කාර්මික					
කාර්මික සහායකයන්	MA2-2	ද්විතික	17	03	14
කළමනාකරණ සහායකයන්					
කළමනාකරණ සහායකයන්	MA1-2	ද්විතික	27	18	09
ප්‍රාථමික මට්ටම - පුහුණු					
ක්ෂේත්‍ර සහායකයන්	PL-3	ප්‍රාථමික	20	13	07
ප්‍රාථමික මට්ටම - නුපුහුණු					
කාර්යාලීය සහයක / කම්කරු	PL-1	ප්‍රාථමික	20	13	07
මුළු ගණන			160	98	62

කාර්යය මණ්ඩලයේ සංයුතිය



ජ්‍යෙෂ්ඨ මට්ටමේ සංයුතිය



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

1. හැඳින්වීම

ජාතික සහ පුද්ගල දෘෂ්ටිකෝණයන්ගෙන් බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ සැලසුම් සකසා ඇත. සෑම පුරවැසියෙකුට ම, සෑමවිට ම විශ්වාසනීය ලෙස හා දැරිය හැකි මිලකට පිවිතුරු බලශක්තිය සැපයීම රජයේ ඉලක්කයයි.

ශ්‍රී ලංකාවේ විදුලි බල ක්ෂේත්‍රය වර්තමානයේදී අභෝයෝග රැසකට මුහුණ දී සිටියි. විශේෂයෙන් ම දැරිය හැකි මිලකට මුළු රටට ම අඛණ්ඩ විදුලිය සැපයීම සම්බන්ධයෙන් මෙන්ම තාප විදුලිය නිෂ්පාදනය සඳහා ආනයනය කරන ලද පොසිල ඉන්ධන මත දැඩි ලෙස යැපීම හේතුවෙන් ආර්ථිකයට ඇති වන අහිතකර බලපෑම් ද මුල් කරගෙන මෙම අභියෝග මතුව තිබේ. මෙම ගැටළු විසඳීම සඳහා රජය 2021 නොවැම්බර් මාසයේදී නව බලශක්ති ප්‍රතිපත්ති නියෝගයක් අනුමත කළේ ය. 2030 වසර වන විට රටේ සමස්ත විදුලි ඉල්ලුමෙන් 70% ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සපුරාලීමත් 2050 වසර වන විට විදුලි උත්පාදන ක්‍රියාවලියේදී කාබන් උදාසීනත්වය ළඟා කර ගැනීමත් අරමුණ යැයි එම නියෝගයෙහි සඳහන් වේ.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහාත්, බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහාත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය උපාය මාර්ග කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. ඒ අතර:

- සියලු ආකාරයේ පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීම
- සියලු බලශක්ති අගය දාම භාවිතයට ගනිමින් බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය වැඩි දියුණු කිරීම
- පොසිල ඉන්ධන මත පදනම් වූ බලශක්ති පද්ධතියක සිට තිරසාර බලශක්ති පාදක පද්ධතියකට සංක්‍රමණය වීමට අවශ්‍ය පහසුකම් සපයන ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ක්‍රමවත්ව සකස් කිරීම
- තිරසාර බලශක්ති ආයෝජන සඳහා හිතකර පරිසරයක් රට අභ්‍යන්තරයෙහි නිර්මාණය කිරීම
- නව තිරසාර බලශක්ති තාක්ෂණයන් හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම
- තිරසාර ජීවන රටාවන්, වාසස්ථාන සහ වටපිටාවන්වලට අනුගත වීමට මහජනතාව දිරිමත් කිරීම

2. සාරාංශය

පශ්චාත් කොවිඩ් ප්‍රතිසාධන ප්‍රයත්නයක් ලෙස 2021 දී ඇති කළ ගම්‍යතාව 2022 අග භාගය දක්වා මැනවින් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමත් විය. පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කාර්යක්ෂමතා යන අංශ දෙකෙහි ම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ක්‍රියාකාරී විණ.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධන අංශය:
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, විවිධ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන්, ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්ෂේත්‍රයේ සුවිශේෂී සන්ධිස්ථානයක් අත්කර ගෙන ඇත. මෙගාවොට් 4,743 ක සම්පූර්ණ ස්ථාපිත ධාරිතාවෙන් පියැසි මත ඉඳි කළ සූර්ය විදුලි පද්ධති ද ඇතුළුව මුළු පුනර්ජනනීය බලශක්ති ධාරිතාව 31.7% දක්වා ළඟා වී ඇත. සමස්ත ජනනයෙන් 18.6%ක් වන නව පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා සැලකිය යුතු දායකත්වයක් මෙමඟින් සනිටුහන් කෙරේ.

2022 දී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්වකීය ඉලක්කගත ව්‍යාපෘති සහ වැඩසටහන් බොහොමයක් සාර්ථකව ක්‍රියාත්මක කළ අතර, සමස්ත ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 67%ක් බවට පත්ව තිබිණ. ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන මත යැපීම අවම කර වඩාත් තිරසාර බලශක්ති අනාගතයක් කරා සංක්‍රමණය කිරීමේ ප්‍රයත්නයන්හිදී මෙම ආරම්භය සැලකිය යුතු ඉදිරි පියවරක් වන්නේ ය.

2022 වසරේදී පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය කිරීමේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. සියඹලාණ්ඩුව, පුනරින් සහ මන්නාරම යන ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති උද්‍යාන ව්‍යාපෘති සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරයි. සියඹලාණ්ඩුව ව්‍යාපෘතියෙහි ටෙන්ඩර් ක්‍රියාවලිය අවසන් කර ඇති අතර අනෙක් ව්‍යාපෘති දෙක අනුමත කිරීමේ අවසන් අදියරට පැමිණෙමින් පවතී.

සූර්ය බල සංග්‍රාමය වැඩසටහන මඟින් පියැසි මත සූර්ය බල පද්ධති 45,845කට අධික ප්‍රමාණයක් ස්ථාපනය කර ඇත. මෙගාවොට් 660ක සමුච්චිත ධාරිතාවක් එකතු කෙරී ඇති අතර එය සැලකිය යුතු දායකත්වයක් ලෙස සැලකෙයි. රටේ සමස්ත වාර්ෂික විදුලි ඉල්ලුමෙන් 5%කට ආසන්න ප්‍රමාණයක් මෙමඟින් සපුරාලන ලදී. 2022 වසරේදී වැඩසටහනෙන් මෙගාවොට් 145ක ධාරිතාවක් එකතු කෙරුණු අතර, මෙගාවොට් 150 ඉලක්කය කරා ළඟා වීමට හැකි විණ.

මෙයට අමතරව, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2023-2026 කාලසීමාව සඳහා පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම සම්පූර්ණ කරන ලදී. පුනරින් සහ මන්නාරම ප්‍රදේශවල සුළං කුළුණු සවි කරමින් සම්පත් තක්සේරු කිරීමේ වැඩසටහන අඛණ්ඩව ම ක්‍රියාත්මක කරගෙන යන ලදී.

බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය:

- බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වැඩසටහන් කිහිපයක් ක්‍රියාවට නංවා ඇත.
- බලශක්ති ඉතිරිකිරීමේ ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා වාණිජ හා කාර්මික අංශවල බලශක්ති විගණන පැවැත්වීම.
- ශීතකරණ, වායු සමීකරණ, ජල තාපක වැනි විවිධ උපකරණ සඳහා අනිවාර්ය බලශක්ති ලේබල් කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- ගොඩනැගිලි කේත ක්‍රියාත්මක කිරීම මඟින් බලශක්ති කාර්යක්ෂමතා පවත්වා ගැනීමේ අවශ්‍යතාව දැඩි ලෙස බලාත්මක කිරීම.
- බලශක්ති සංරක්ෂණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- විද්‍යා විෂයෙහි ශිෂ්‍ය කේන්ද්‍රීය සහ අන්තර්ක්‍රියාකාරී ඉගැන්වීම් වැඩිදියුණු කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයට යෙදවුම් සැපයීම.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි මෙම උත්සාහයන්හි අරමුණ වන්නේ ශ්‍රී ලංකාව සඳහා වඩාත් තිරසාර සහ බලශක්ති කාර්යක්ෂම අනාගතයක් සාක්ෂාත් කර ගැනීමයි.

3.0 පුනර්ජනනී බලශක්ති සංවර්ධන වැඩසටහන්

සැපයුම් පාර්ශ්වීය කළමනාකරණ අංශයේ අරමුණ වන්නේ බලශක්ති සුරක්ෂිතතාව ඉහළ නැංවීමේ සහ රටට ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් පුනර්ජනනීය බලශක්ති සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ සංවර්ධනය කිරීමයි. සම්පත් සිතියම්ගත කිරීම, පර්යේෂණ සහ සංවර්ධන, පුනර්ජනනීය බලශක්ති සේවා, සහ සම්පත් සංවර්ධන හා පහසුකම් සැලසීමේ අංශ මඟින් ක්‍රියාතමක කරනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන්වල ප්‍රගතිය මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

3.1 සම්පත් සිතියම්ගත කිරීම

3.1.1 සම්පත් සංවර්ධන සැලසුම්කරණය

රටේ ඇති සියලුම පුනර්ජනනීය බලශක්ති සම්පත් හඳුනා ගැනීමේ, සංරක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ වගකීම දරන්නේ සිතියම්කරණ අංශයයි. සියලු පුනර්ජනනීය බලශක්ති සම්පත්, ඒවායේ විභව ධාරිතාව සහ ව්‍යාපෘති ස්ථාන ඇතුළත් ඉන්වෙන්ටරියක් 2021 වසරේදී ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව, පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීම ද එම අංශය විසින් එකී වර්ෂයේදී ම ආරම්භ කරන ලදී. ප්‍රමුඛතා විභව භූමි සහ ඉඩම් හිමිකම හඳුනාගැනීම ද පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්මට ඇතුළත් ය.

2030 වන විට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් 70% ක විදුලි උත්පාදනයක් ලබා ගැනීමේ ඉලක්කයට දායක වන පරිදි පුනර්ජනනීය බලශක්ති සම්පත් සඳහා විභව ස්ථාන හඳුනා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සහයෝගීතාව ද ඇතිව පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම 2022 දී සංශෝධනය කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා භූ අවකාශීය විද්‍යා යෙදුම් භාවිතා වේ. ඉඩම් පරිහරණ රටාවන්, සම්පත් විභවයන්, ඉඩම් ලබා ගැනීමේ හැකියාව සහ බිම් සත්‍යාපනය වැනි සාධක සලකා බලමින් අදාළ රේඛීය ආයතන සමඟ උපදෙස් සාකච්ඡා පැවැත්වී ය.

මෙම ව්‍යායාමයේ ප්‍රතිඵලයක් ලෙස මෙගා වොට් 500ක සුළං සහ සූර්ය බලශක්ති ව්‍යාපෘති ස්ථාන හඳුනාගැනීමට හැකි විණ.

3.1.2 සම්පත් තක්සේරුව

සූර්යය බලශක්තිය සහ සුළං බලය කෙරෙහි අවධානය යොමු කරමින් අතීතයේ සිදු කරන ලද පුනර්ජනනීය බලශක්ති සම්පත් තක්සේරු ක්‍රියාකාරකම්, සම්පත් වර්ග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කරන ලදී.

ව්‍යාපෘති සඳහා බැංකු මඟින් මූල්‍ය සිදු කර ගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා දිගුකාලීන සම්පත් දත්තවල වැදගත්කම හඳුනා ගනිමින්, කාලගුණ දත්ත රැස් කිරීම පහත සඳහන් මූලපිරීම් යොදා ගනිමින් අඛණ්ඩව සිදු කර ඇත.

- පුනරින් සහ මන්නාරමේ සුළං කුළුණු සවිකිරීම් අවසන් කිරීම
- නඩුකුඩා සුළං මිනුම් කුළුණ භාවිතයට ගනිමින් සුළං දත්ත ලබා ගැනීම
- සියඹලාණ්ඩුව කාලගුණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ එක්ව කුරුණෑගල, අනුරාධපුරය, වවුනියාව, යාපනය, හම්බන්තොට, මොණරාගල, පොතුවිල්, මන්නාරම, පුත්තලම, මාතලේ, බදුල්ල සහ රත්නපුර යන ස්ථානවල පිහිටි ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන 12කින් කාලගුණ දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- ස්ථාපිත බලාගාරවල ජනන දත්ත ඒකරාශී කර දැනට පවතින සූර්ය හා සුළං සම්පත් දත්ත සත්‍යාපනය කිරීම

ශ්‍රී ලංකාව තුළ තිරසාර බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා අවශ්‍ය වන පුනර්ජනනීය බලශක්ති සම්පත් පිළිබඳ සවිස්තරාත්මක සහ යාවත්කාලීන කරන ලද දත්ත ගබඩාවක් පිහිටුවීමට මෙම ක්‍රියාකාරකම් දායක වේ.

3.2 පර්යේෂණ සහ සංවර්ධන

ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට අදාළ අවස්ථා ගවේෂණය කිරීම සහ තාක්ෂණික හෝ වෙනත් සීමාවන් විසඳීම කෙරෙහි පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් අවධානය යොමු කෙරේ. බලශක්ති උද්‍යාන "ආයෝජනයට සූදානම් ව්‍යාපෘති" ලෙස සංවර්ධනය කිරීම එවැනි එක් ආරම්භයකි. මෙම ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනය, පාරිසරික බලපෑම් ඇගයීම, සමාජ බලපෑම් ඇගයීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම ඇතුළත් වේ.

3.2 පර්යේෂණ සහ සංවර්ධන

2018 වසරේ කැබිනට් අනුමැතිය ඇතිව ආරම්භ කරන ලද සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. පූර්ව සංවර්ධන ක්‍රියාකාරකම් සහ අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලි 2021 දී අවසන් කරන ලද අතර, ව්‍යාපෘතිය 2022 දී ලංකා විදුලිබල මණ්ඩලය විසින් ටෙන්ඩර් කරන ලදී.

ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සහ ගස් නැවත සිටුවීමේ වැඩසටහන් වැනි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව මේ වන විට ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව, කාලගුණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇති අතර, ව්‍යාපෘති සංවර්ධනය සඳහා සුදුසු වන දත්ත වසරක් සඳහා 2022 දී ලබා ගන්නා ලදී. පුනර්ජනනීය බලශක්ති අරමුණු සාක්ෂාත් කරගනිමින් සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව තවදුරටත් සිදු කෙරේ. එනිසා එම ව්‍යාපෘතිය කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ගනිමින් තිබේ. මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත වාර්ෂික විදුලි උත්පාදනය ගිගාවොට් පැය 180 කි. පිවිතුරු හා තිරසාර විදුලිය සැපයීම පමණක් නොව, දළ වශයෙන් මෙට්‍රික් ටොන් 131,364ක වාර්ෂික කාබන්ඩයොක්සයිඩ් විමෝචනය අඩු කිරීම සඳහාත් මෙම ව්‍යාපෘතිය දායක වන අතර එමඟින් පරිසරයට ධනාත්මක බලපෑමක් ඇති කෙරේ. මෙයට අමතරව, සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතියෙන් වාර්ෂිකව ඩීසල් ලීටර් 45,000,000ක පමණ ඉන්ධන ඉතිරියක් ද සිදු වේ. මෙම ප්‍රතිඵල ළඟා කරගෙන තිබෙන්නේ ග්‍රිඩ් සාධකය කිලෝවොට් පැයට කාබන් කිලෝග්‍රෑම් 0.7298ක් සහ කිලෝවොට් පැය එකක විදුලිය ප්‍රමාණයක් උත්පාදනය කිරීමේදී ඩීසල් ලීටර 4ක් ඉතිරි කෙරෙන බව උපකල්පනය කරමිනි. හරිත හා තිරසාර අනාගතයක් කරා සංක්‍රමණය වීමේදී සූර්ය බලශක්ති විභවය සඳහා සියඹලාණ්ඩුව සූර්ය ව්‍යාපෘතිය නිදර්ශනයක් වේ.

3.2.2 මෙගා වොට් 234ක ධාරිතාවක් සහිත පුනර්ජන සුළං බල ව්‍යාපෘතිය

අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති පුනර්ජන ව්‍යාපෘතිය අදාළ රේඛීය ආයතනවලින් ලබාගත් යම් යම් අනුමැතියන් සමඟ ප්‍රගතියක් ලබා ඇත. පෞද්ගලික ඉඩම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා මෙගාවොට් 100ක සුළං බල ධාරිතාවක් උත්පාදනය කෙරෙන අතර, මූලික ව්‍යාපෘති සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.

ව්‍යාපෘතියට සම්බන්ධ පාරිසරික සමාජ බලපෑම් ඇගයීම් අධ්‍යයනය මේ වනවිට අවසන් වෙමින් තිබේ. මේ අතර වවුලන් පිළිබඳ අධ්‍යයනයේ මූලික කටයුතු සාර්ථකව නිම කර ඇත. මෙම පියවර සමඟ පුනර්ජන ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබේ.

පුනර්ජන සුළං බල ව්‍යාපෘතිය පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ වැදගත් ව්‍යාපාරයකි. මෙගාවොට් 234 ක ස්ථාපිත ධාරිතාව සහිතව, ව්‍යාපෘතියෙන් වාර්ෂිකව ගිගාවොට් පැය 807ක බලශක්ති ප්‍රමාණයක් උත්පාදනය කර ගැනීමට ඇස්තමේන්තු කර ඇත. සැලකිය යුතු මෙම ප්‍රතිදානය වාර්ෂිකව මෙට්‍රික් ටොන් 588,948 ක පමණ කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අඩු කිරීමක් සඳහා දායකත්වය සපයයි. කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අවම කිරීම, දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. තවද, මෙම ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව ඩීසල් ලීටර් 201,750,000 ක පමණ ඉන්ධන ඉතිරියක් සිදු කෙරේ.

මෙම සාධනීය තත්ත්වය සාක්ෂාත් කරගෙන තිබෙන්නේ සුළං සම්පත් උපයෝගී කර ගනිමිනි. පිරිසිදු බලශක්ති උත්පාදනය සඳහා මෙම ව්‍යාපෘතියේ සැලකිය යුතු දායකත්වයක් දක්වන බව පැහැදිලි ය. එසේ ම සාම්ප්‍රදායික ඉන්ධන ප්‍රභවයන් මත යැපීම අඩු කිරීම සඳහා ද මෙම ව්‍යාපෘතියෙන් දායකත්වය සපයනු ලැබේ. තිරසාර සංවර්ධනය ඇති කර ගැනීමේදීත්, පාරිසරික ගැටළුවලට විසඳුම් සෙවීමේදීත් සුළං බල ශක්ති විභවයේ වැදගත්කම කෙතෙක් ද යන්න දැක්වීමට පුනර්ජන සුළං බල ව්‍යාපෘතිය නිදර්ශනයකි.

3.2.3 මෙගා වොට් 286ක ධාරිතාවක් සහිත මන්නාරම සුළං බල ව්‍යාපෘතිය

විවිධ ක්‍රියාකාරකම් සමඟින් මන්නාරම ව්‍යාපෘතිය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ශක්‍යතා අධ්‍යයනයක් පැවැත්වීම, ඩ්‍රෝන් සමීක්ෂණය, කුරුල්ලන් සහ වවුලන් පිළිබඳ අධ්‍යයනය, පාරිසරික අධ්‍යයනය සහ ඉඩම් අත්පත් කර ගැනීම යන ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු රේඛීය ආයතන කිහිපයකින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මේ වනවිට වනජීවී දෙපාර්තමේන්තුවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටියි. විදේශීය උපදේශකයකු සිදු කළ පක්ෂි පිළිබඳ අධ්‍යයනයේ විශ්ලේෂණය අවසන් වූ පසු එය ලබා දෙනු ඇත. පූර්ව සංවර්ධන කටයුතු අවසන් වූ පසු, ඉදිකිරීම් අනුමැතිය ලැබීමට නියමිත ය.

මන්නාරම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය තක්සේරු කිරීම් සහ අනුමැතිය ලබා ගනිමින් ක්‍රමානුකූලව සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වාර්ෂික විදුලි උත්පාදනය ගිගාවොට් පැය 1,048 කි. මෙම විදුලි ජනනයෙන් හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමට ධනාත්මක බලපෑමක් ඇති කෙරේ. දළ වශයෙන් මෙට්‍රික් ටොන් 764,830 ක වාර්ෂික කාබන්ඩයොක්සයිඩ් විමෝචනය අඩු කිරීමක් සඳහා එය දායක වේ. මෙයට අමතරව, මෙම ව්‍යාපෘතියෙන් වාර්ෂිකව ඩීසල් ලීටර් 262,000,000ක පමණ ඉන්ධන ඉතිරියක් ද සිදු වේ. සුළං බල ව්‍යාපෘතිය මඟින් තිරසාර බලශක්ති උත්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීම සඳහා සුළං ශක්තියේ විභවය හේතු වන අන්දම මන්නාරම දෙවන අදියර මඟින් තවදුරටත් තහවුරු කෙරේ.

3.2.4 මැතකදී හඳුන්වා දුන් ජාතික ව්‍යාපෘති

මෙගාවොට් 210 ක ධාරිතාවයකින් යුත් වේරවිල් සුළං බල ව්‍යාපෘතිය 2022දී ආරම්භ කරන ලද අතර එය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ව්‍යාපෘතියට යොමු නියමයන් ලැබී ඇත. මෙයට අමතරව, පාරිසරික බලපෑම් අධ්‍යයන ක්‍රියාවලියේ කොටසක් ලෙස අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සියේ සහාය ඇතිව පක්ෂීන් පිළිබඳ අධ්‍යයනයක් ආරම්භ කර ඇත. සම්ප්‍රේෂණ මාර්ගය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා ආරම්භ කර තිබේ.

ව්‍යාපෘතියේ තීරණාත්මක සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් පක්ෂීන් පිළිබඳ අධ්‍යයනය 2024 මැයි මස අවසන් වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. වේරවිල් සුළං බල ව්‍යාපෘතිය ශීඝ්‍ර ප්‍රගතියක් අත්පත් කරගනිමින් තිබේ. එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා විවිධ අධ්‍යයන සහ සාකච්ඡා ද සිදු කෙරෙමින් ඇත.

3.2.5 ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතිය සඳහා පුහුණු මධ්‍යස්ථානය

"ශ්‍රී ලංකා පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ සඳහා පුහුණු මධ්‍යස්ථාන" ව්‍යාපෘතියේ අරමුණ වී තිබෙන්නේ ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ ක්ෂේත්‍රයේ ඇති කුසලතා ඉහළ නැංවීමේ අවශ්‍යතාවලට ආමන්ත්‍රණය කිරීමයි. මෙම සහයෝගීතා ව්‍යාපෘතියට යුරෝපයේ විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය සම්බන්ධ වේ.

උක්ත ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ඉලක්කගත පුහුණු වැඩසටහන් මඟින් පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ පුද්ගලයින්ගේ විශේෂඥතාව සහ දැනුම වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීමයි. අධ්‍යයන ආයතන සහ කර්මාන්ත සංගම් ඒකරාශී කිරීමෙන් බලාපොරොත්තු වන්නේ දැනට පවතින නිපුණතා ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම ය.

3.3 පුනර්ජනනීය බලශක්ති සේවා

ජාතික පද්ධතියෙන් පරිබාහිර පුනර්ජනනීය බලශක්ති පද්ධති සංවර්ධනයට පහසුකම් සැපයීමටත්, පියැසි මත සූර්ය බල පද්ධති ඉඳි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් පුනර්ජනනීය බලශක්ති සේවා අංශයෙන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කෙරෙයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2021- 2025 සඳහා වන ආයතනික සැලැස්මට සමගාමීව 2025 වන විට පියැසි මත ඉඳි කළ සූර්ය විදුලි පද්ධති මඟින් මෙගාවොට් 1000ක සමුච්චිත ධාරිතාවක් සාක්ෂාත් කර ගැනීම මෙම අංශයේ මූලික උපායමාර්ගික අරමුණ වේ.

ජාතික පද්ධතියෙන් පරිබාහිර විදුලිය ජනනය සඳහා අවධානය යොමු කරමින් ද, පියැසි මත සූර්ය විදුලි පද්ධති ස්ථාපනය ප්‍රවර්ධනය කරමින් ද පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ සමස්ත තිරසාර ඉලක්ක සඳහා දායක වීම අංශයේ අරමුණයි. විවිධ මුලපිරීම් සහ වැඩසටහන් මඟින් පුනර්ජනනීය බලශක්ති සේවා අංශය රටේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් වර්ධනයට සහ ක්‍රියාත්මක කිරීමට සක්‍රීයව සහාය දක්වනු ලැබේ.


3.3.1 සූර්යබල සංග්‍රාමය

"සූර්යබල සංග්‍රාමය" වැඩසටහන, ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්තිය පුළුල් ලෙස භාවිතයට ගැනීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රමුඛ මුලපිරීමකි. 2016 දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන රට පුරා සූර්ය පියැසි පද්ධතිවල ධාරිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

සූර්යබල සංග්‍රාමය වැඩසටහන තිරසාර සහ ලාභදායී විකල්පයක් ලෙස, සූර්ය බලශක්තිය භාවිතය සඳහා ගෘහස්ත, වාණිජ සහ කාර්මික පාරිභෝගිකයින් දිරිමත් කරමින් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. සූර්ය විදුලි උත්පාදනය ප්‍රවර්ධනය කෙරෙන මෙම වැඩසටහනෙන් සාම්ප්‍රදායික බලශක්ති ප්‍රභවයන් මත රට යැපීම අඩු කර තිබේ. එපමණක් නොව සම්ප්‍රදායික විදුලි උත්පාදන ක්‍රම හා සම්බන්ධ පාරිසරික බලපෑම ද ඉන් අවම කර ඇත.

ශ්‍රී ලංකාවේ පියැසි මත ඉඳි කර ඇති සූර්ය විදුලි පද්ධතිවල ශීඝ්‍ර වර්ධනයක් රූප සටහන 01න් පෙන්නුම් කෙරෙයි. සූර්ය බලශක්ති භාවිතයේ සැලකිය යුතු ප්‍රගතියත්, වැඩිවන ජනප්‍රියත්වයත් පෙන්නුම් වියින් නිරූපණය වේ. පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සහ රටේ තිරසාර බලශක්ති සංක්‍රාන්තිය සඳහා ක්‍රියාකාරිව සහභාගී වීමට පුද්ගලයින් බලගැන්වීමට සූර්යබල සංග්‍රාමය වැඩසටහන තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත.

පියැසි මත ඉඳි කරන ලද සූර්ය විදුලි පද්ධතිවල වර්ධනය
(මෙගා වොට්)



සටහන 01: ශ්‍රී ලංකාවේ පියැසි මත ඉඳි කරන ලද සූර්ය විදුලි පද්ධතිවල වර්ධනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් ක්‍රියාත්මක සූර්ය බල සංග්‍රාම වැඩසටහන 2022 වසරේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන තිබේ. එහි කැපී පෙනෙන අවස්ථාවන් මෙසේ ය:

- **ස්ථාපිත ධාරිතාව:** මෙගාවොට් 660 සම්පූර්ණ ස්ථාපිත ධාරිතාවක් පියැසි මත ඉඳි කරන ලද සූර්ය විදුලි පද්ධති මඟින් ලබා ගන්නා ලදී. මෙම ධාරිතාව ස්ථාන 45,845 ක් පුරා පැතිරී ඇති අතර, සූර්ය බලශක්තිය පුළුල් ලෙස භාවිතා කිරීම එමඟින් පෙන්නුම් කෙරෙයි.

- **සේවා සපයන්නන්:** 2022 වසරේදී සේවා සපයන්නන් 410ක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි වී ඇත. පියැසි මත සූර්ය බලශක්ති විදුලි පද්ධති ස්ථාපනය කිරීමේදී ඒ සඳහා සහ අවශ්‍ය පහසුකම් සැලසීමේදී මෙම සැපයුම්කරුවෝ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ.

- **රැකියා අවස්ථා:** සූර්ය බලශක්ති කර්මාන්තය සැලකිය යුතු රැකියා අවස්ථා සංඛ්‍යාවක් නිර්මාණය කර ඇත. 2022 අවසානය වන විට රැකියා 10,100ක් එමඟින් ජනනය කෙරිණ. ඉංජිනේරුවෝ 1,250ක්, කාර්මික ශිල්පීහු 3,450ක් සහ තාක්ෂණික නොවන නිලධාරීහු 5,400 ක් ඊට ඇතුළත් වූහ. රැකියා අවස්ථා වර්ධනය මඟින් ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්ති ක්ෂේත්‍රය ප්‍රසාරණය වීම පිළිබිඹු කෙරේ.

- **තාක්ෂණික පුහුණුව:** තාක්ෂණික විශේෂඥතාව වැඩිදියුණු කිරීම සඳහා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සමඟ එක්ව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ පුහුණු වැඩසටහන් පහක් පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අභ්‍යාසලාභීහු කිහිපදෙනෙක් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමේ 3 වන සහ 4 වන නිපුණතා මට්ටම් අත්පත් කර ගත්හ. මෙම කර්මාන්තයෙහි නිපුණ පුද්ගලයින්ගේ වර්ධනය එමඟින් පෙන්නුම් කෙරෙයි.

- **කුසලතා සංවර්ධනය:** ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ එක්ව දෙදින නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විදුලි කාර්මිකයෝ 1500ක් ඊට සහභාගී වූහ. විදුලි කාර්මිකයන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ සූර්ය තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහන්වල අරමුණ විණ.

- **සූර්ය විදුලි ආලෝක පද්ධති**: වැඩසටහනේ කොටසක් ලෙස විහාරස්ථානවල සහ රාජ්‍ය ආයතනවල සූර්ය විදුලි ආලෝක පද්ධති සවි කිරීම ද සිදු විය. සාම්ප්‍රදායික බලශක්ති ප්‍රභවයන් මත යැපීම අඩු කිරීමත්, පිවිතුරු සහ තිරසාර ආලෝක විසඳුම් සැපයීමත් මෙම වැඩපිළිවෙළෙහි අරමුණ විය.

අවම පාරිසරික හා සමාජීය ප්‍රතිවිපාක සහිතව විදුලිය උත්පාදනය කිරීමේ විකල්ප ප්‍රභවයක් ලෙස පියැසි මත සූර්ය විදුලි පද්ධති ඉඳි කිරීමේ වටිනාකම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අවබෝධ කරගෙන ඇත. විශේෂයෙන් ම බලශක්ති ගබඩා කිරීම මඟින් පියැසි මත සූර්ය විදුලි පද්ධති ඉඳි කිරීමේ වැඩසටහනේ විෂය පථය තවදුරටත් ඉදිරියට ගෙන යෑමට අධිකාරිය අපේක්ෂා කරයි.

3.3.2 මෙගාවොට් 135 ක ධාරිතාව සහිත සූර්ය බලාගාර ශ්‍රී ලංකාවේ ඉදි කිරීමට ඉන්දීය ණය වැඩ පිළිවළින් (Indian Line of Credit) සහාය ලබාදීම

ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්ති සංවර්ධනයේ ප්‍රගතියට සහාය දක්වමින් ඉන්දීය රජය, ඉන්දියාවේ එක්සිම් බැංකුව මාර්ගයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 100ක ණය මුදලක් ලබා දී ඇත. මෙම වැඩසටහන ආරම්භ කිරීමට සැලසුම් කෙරුනේ 2023 වසරේදී ය. වැඩසටහන වසර තුනක කාලයක් ක්‍රියාත්මක කෙරෙන අතර රට තුළ සූර්ය බලශක්තිය භාවිත කිරීම වේගවත් කිරීම එහි අරමුණුයි.

වැඩසටහන ප්‍රධාන කොටස් කිහිපයකින් සමන්විත වේ.

- **රජයේ ගොඩනැගිලිවල පියැසි මත මෙගාවොට් 120ක සූර්ය බල විදුලි පද්ධති ස්ථාපනය කිරීම:** රජයේ ගොඩනැගිලිවල පියැසි මත සූර්ය පැනල සවි කිරීමෙන් සූර්ය බලශක්ති විභවය උපයෝගී කර ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරෙයි.
- **මෙගාවොට් 10ක බැටරි ගබඩා පහසුකම් සහිත පියැසි මත ඉඳි කරන සූර්ය බල විදුලි පද්ධති අඩු ආදායම්ලාභී නිවාස සඳහා ලබාදීම:** ග්‍රාමීය ප්‍රජාවන්ගේ, විශේෂයෙන් ම අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන මෙය ආරම්භ කර ඇත. බැටරි ගබඩා පහසුකම සහිත සූර්යය විදුලි පද්ධති ලබා දීමෙන්, විශ්වසනීය ලෙස සහ දැරිය හැකි අන්දමෙන් විදුලිය ලබාගැනීම සඳහා එම පවුල් ප්‍රවේශ කෙරේ. එමඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට හැකිවනු ඇත. මෙයට අමතරව, ආගමික ස්ථාන සඳහාත් ප්‍රතිආශ්‍රැති යන්ත්‍ර සඳහාත් සූර්ය විදුලි පද්ධති ක්‍රියාත්මක කෙරේ.
- **මෙගාවොට් 5ක පාවෙන සූර්ය බලාගාර ව්‍යාපෘති ස්ථාපනය කිරීම:** ජලාශ හෝ විල් වැනි ජල මූලාශ්‍ර භාවිතා කර පාවෙන සූර්ය බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම සංරචකයට ඇතුළත් වේ. එය සූර්ය පැනල සඳහා ඉඩම් භාවිතය අඩු කිරීම සඳහා ප්‍රශස්ත පියවරක් වේ. එපමණක් නොව ජල වාෂ්පීකරණය අඩු කිරීමත් විදුලි උත්පාදන කාර්යක්ෂමතාව වැඩි කිරීමත් යන අමතර ප්‍රතිලාභ ද ඉන් ලැබෙයි.


වැඩසටහනේ බහුවිධ ප්‍රවේශ හේතුවෙන්, ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සහ බලශක්ති අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට එමඟින් අවකාශය ලැබෙයි.

3.4 සම්පත් වෙන්කිරීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම්

පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම සහ සංවර්ධන ක්‍රියාකාරකම්, රට පුරා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය දරන උත්සාහය අත්‍යවශ්‍ය වේ. ජාලගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා බලශක්ති බලපත්‍ර සහ තාවකාලික අනුමැතිය නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එමඟින් එම ව්‍යාපෘති සංවර්ධනය සඳහා අවශ්‍ය නියාමන රාමුව ක්‍රියාත්මක බව සහතික කරයි.

ශ්‍රී ලංකාවේ නව පුනර්ජනනීය බලශක්ති ධාරිතාවයේ කැපී පෙනෙන වර්ධනයක් ඇති වී තිබෙන බව 2 වන රූප සටහනෙන් පෙන්නුම් කෙරේ. 1996 සිට 2022 දක්වා ධාරිතාව එකතු වීම (පියැසි මත ඉඳි කෙරෙන සූර්ය විදුලි පද්ධති හැර) ශීඝ්‍රයෙන් වැඩිවී ඇති අන්දම ප්‍රස්ථාරයෙන් පිළිබිඹු වෙයි. නව පුනර්ජනනීය බලශක්තියේ සම්පූර්ණ ස්ථාපිත ධාරිතාව මේ වනවිට මෙගාවොට් 846කි.

සම්පත් වෙන් කිරීම සහ සංවර්ධනය කෙරෙහි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අවධානය යොමු කිරීම, මෙම වර්ධනයට ඉවහල් වී ඇත. සුදුසු ස්ථාන හඳුනාගෙන අවශ්‍ය අනුමැතිය ලබා දීමෙන්,ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පුනර්ජනනීය බලශක්ති ආයෝජන සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ සැලකිය යුතු ප්‍රසාරණයක් සිදු වීමට මෙම උත්සාහයන් දායක වී ඇත.



සටහන 02: නව පුනර්ජනනී බලශක්ති ධාරිතාව

ප්‍රභවය		2022 වසර අවසන් වන විට සවි කර ඇති ධාරිතාව (මෙගා වොට්)	2022 එකතු කරන ධාරිතාව	2022 PPA අත්සන් කරන ලද ව්‍යාපෘති	2022දී බලශක්ති බලපත්‍ර නිකුත් කළ ව්‍යාපෘති
කුඩා ජල විදුලි බලාගාර	414.00	414.00	0.00	11.54	39.40
සුළං	252.00	252.00	0.00	0.00	125.00
සූර්ය	100.00	130.00	30.00	15.90	333.67
වෙනත්	50.00	50.00	0.00	5.00	25.75
මුළු	816.00	846.00	30.00	32.44	523.82
පියැසි සූර්යය බල පද්ධති	515.60	660.20	145.00	N/A	N/A
නව පුනර්ජනනීය මුළු	1,331.60	1506. 20	175.00	32.44	523.82

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි එබඳු උත්සාහයන් තුළ වූවද, පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 438ක අපේක්ෂිත ධාරිතාවක් එකතු කර ගැනීම සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය (වගුව 01). ඒ වෙනුවට, නිශ්චිත කාල සීමාව තුළ එකතු කර ගත හැකි වූයේ පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 175 ක් පමණි. රුපියලේ අගය අවප්‍රමාණය වීම, උද්ධමන අනුපාත ඉහළ යෑම, බැංකු පොළී අනුපාත ඉහළ යෑම, ඩොලරයේ අගය ඉහළ යෑම ඇතුළු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මුහුණ දෙන විවිධ අභියෝග මෙම අඩුවීමට හේතු වූවා විය හැකි ය.

මෙම අභියෝගවලට මුහුණ දීම සඳහාත් මෙගාවොට් 10 දක්වා ධාරිතාවයකින් යුත් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ප්‍රගතියට පහසුකම් සැලසීම සඳහාත් 2022 අගෝස්තු 01 වැනි දින කැබිනට් අනුමැතිය ලැබීමෙන් පසු නව ගාස්තුවක් හඳුන්වා දෙන ලදී. ව්‍යාපෘති සංවර්ධනය දිරිගැන්වීම සහ වේගවත් කිරීම අරමුණු කර ගෙන ස්ථර තුනක් සහිත බදු ක්‍රමයක් ක්‍රියාත්මක 2022 සැප්තැම්බර් 1 සිට ක්‍රියාත්මක කෙරිණි. කෙසේ වෙතත්, මෙම පියවරයන් හමුවේ වූවද, බොහෝ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති තවමත් සැලසුම් කර ඇති පරිදි ප්‍රගතිය කරා ළඟා කරවීම දුෂ්කර වී ඇත.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින් මතු කරන ලද ගැටළු සහ දුක්ගැනවිලිවලට ප්‍රතිචාර වශයෙන් කමිටු කිහිපයක් පත් කර ඇත. ඒ, අභියෝග හොඳින් පරීක්ෂා කර ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික නිර්දේශ ලබාදීමට එම කමිටු පත් කර තිබේ. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මුහුණ දෙන නිශ්චිත බාධාවන් හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම, එමඟින් ඒවා නියමිත වේලාවට නිම කිරීමට පහසුකම් සැලසීම සහ රටේ සමස්ත පුනර්ජනනීය බලශක්ති ඉලක්ක වෙත දායක වීම කෙරෙහි මෙම කමිටු අවධානය යොමු කරයි.

4.0 බලශක්ති සංරක්ෂණ වැඩසටහන්වල ප්‍රගතිය

බලශක්ති සංරක්ෂණ වැඩසටහන්, වාණිජ, කාර්මික සහ ගෘහස්ථ යන පාර්ශ්ව වෙත ප්‍රධාන අංශ පහක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

4.1 බලශක්ති කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම

විවිධ දිගුකාලීන වැඩසටහන් සහ මූලපිරීම් මඟින් වාණිජ හා කාර්මික අංශවල බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ බලශක්ති පරිභෝජනය සඳහා මිණුම් සලකුණු ස්ථාපිත කිරීම මෙම උත්සාහයන්ගේ අරමුණයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පහසුකම් සපයන, බලශක්ති සංරක්ෂණයට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ විර්ධනයන් මෙසේ ය:

බලශක්ති කළමනාකරු වැඩසටහන සහ බලශක්ති විගණක වැඩසටහන: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය බලශක්ති කළමනාකරුවන් 236ක් ලියාපදිංචි කර ඇති අතර බලශක්ති විගණකවරුන් 24ක් ප්‍රතිපාදනය කර ඇත. කාර්මික හා වාණිජ අංශවල වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගනිමින් ද බලශක්ති ඉතිරි කිරීම සඳහා පියවර ක්‍රියාත්මක කරමින් ද මෙම වෘත්තිකයෝ බලශක්ති කළමනාකරණය සහ විගණනය යන ක්‍රියාවලීන්හි ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරති.

බලශක්ති සේවා සමාගම්: බලශක්ති කළමනාකරණය සහ කාර්යක්ෂමතාව පිළිබඳ විශේෂිත සේවාවන් සපයන බලශක්ති සේවා සමාගම් 29ක් සමඟ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කරයි. මෙම බලශක්ති සේවා සමාගම්, බලශක්ති ඉතිරි කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීමේදී සහ සමස්ත බලශක්ති කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේදී ආයතනවලට විශේෂඥතාව සහ සහාය ලබා දෙයි.

මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන්: රජයේ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ ඉලක්ක කර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි. බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ මෙහෙයුම්වලදී බලශක්ති ඉතිරි කිරීමේ පිළිවෙත් අනුගමනය කිරීම හේතුවෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කිරීම මෙම වැඩසටහන්වල අරමුණුයි.

බලශක්ති පරිභෝජන මිණුම් සලකුණු නියාමනය: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය බලශක්ති පරිභෝජන මිණුම් ලකුණ ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටියි. මෙම නියාමනය තුළින් සිල්ලර හා මූල්‍ය අංශ කෙරෙහි අවධානය යොමු කරමින් අනිවාර්ය බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ස්ථාපිත කරනු ඇත. බලශක්ති ඉතිරිකිරීමේ මූලිකයන් මෙහෙයවීම සහ මෙම අංශවල සමස්ත බලශක්ති කාර්ය සාධනය වැඩිදියුණු කිරීම මිණුම් සලකුණු සැකසීමෙන් අරමුණු කෙරෙයි.

බලශක්ති පරිභෝජන දත්ත සඳහා වෙබ් අඩවි ද්වාරය: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සියේ (USAID) ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහනේ සහාය ඇතිව බලශක්ති පරිභෝජන දත්ත වාර්තා කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා වෙබ් අඩවි ද්වාරයක් සකස් කරමින් සිටියි. මෙම වෙබ් අඩවිය ආයතනවලට ඔවුන්ගේ බලශක්ති

පරිභෝජනය නිරීක්ෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට මධ්‍යගත වේදිකාවක් සපයනු ඇත. වඩා හොඳ තීරණ ගැනීමට සහ බලශක්ති ඉතිරි කිරීමේ අවස්ථා හඳුනා ගැනීමට එය උපකාරී වනු ඇත.

දැනුවත් කිරීමේ වැඩසටහන්: දැනුවත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයට (JICA) යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මෙම වැඩසටහන, සිල්ලර සහ මූල්‍ය යන ක්ෂේත්‍ර ඉලක්ක කර ගනිමින් ආරම්භ කරනු ඇත. බලශක්ති මිණුම් දණ්ඩ නියාමනය සමඟ සමපාත වෙමින් මෙම කර්මාන්තවල බලශක්ති සංරක්ෂණ වැඩ පිළිවෙළ ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

සමස්තයක් වශයෙන්, බලශක්ති සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි මූලික වැඩ පිළිවෙල, ධාරිතාව ගොඩනැගීම, දැනුවත් කිරීමේ වැඩසටහන්, රෙගුලාසි සැකසීම සහ තාක්ෂණික ප්‍රවර්ධනය යන අංශ ඇතුළත්ව සැකසී ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි අරමුණ වන්නේ වෘත්තිකයන්, සමාගම් සහ විවිධ අංශ ක්‍රියාකාරිව සම්බන්ධ කර ගනිමින් බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ වඩාත් තිරසාර බලශක්ති පරිසරයක් නිර්මාණය කිරීමයි.

4.1.1 බලශක්ති විගණන, උපදේශන සේවා සහ මිනුම් සඳහා පහසුකම් සැලසීම්

උපදේශන සේවා සැපයීම, විමසුම්වලට පිළිතුරු ලබාදීම සහ බලශක්ති විගණන පැවැත්වීම මඟින් බලශක්තිය සම්බන්ධ ගැටළු විසඳීමට කර්මාන්ත, වාණිජ සහ රාජ්‍ය අංශයේ ආයතනවලට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහාය වේ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සඳහාත් මහනුවර ශ්‍රී දළදා මාලිගාව සඳහාත් බලශක්ති විගණනයන් පවත්වන ලදී. තැපැල් දෙපාර්තමේන්තුව සහ කුරුණෑගල රෝහල සම්බන්ධයෙන් බලශක්ති විගණන කටයුතු සිදුවෙමින් පවතී.

4.2 බලශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණ වැඩසටහන

බලශක්ති කාර්යක්ෂම උපකරණ භාවිතය සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාර කිරීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රධාන කාර්යභාරයකි. එම වැඩසටහනේ ප්‍රගතිය පහත දැක් වේ.

විස්තරය	ප්‍රගතිය
එල්.ඊ.ඩී. පහන් සඳහා අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන්	අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් ලේබල් කිරීමේ ක්‍රමය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ.
එල්.ඊ.ඩී. පැනල සඳහා අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන්	අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් ලේබල් කිරීමට අදාළ මාධ්‍ය අන්තර්ගතය සැකසීම අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් සකසා අවසන්. එය ඉක්මනින් ප්‍රකාශයට පත් කෙරේ.
ජල පොම්ප සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණ වැඩසටහන	ජල පොම්ප සඳහා බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් සකසා අවසන් කර ඇත. පොම්ප පරීක්ෂණ පහසුකම ප්‍රසම්පාදනයට අදාළ මූලික කටයුතු අවසන් කරන ලදී.
සිවිලින් විදුලි පංකා සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණ වැඩසටහන	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි ස්ථාපිත පරීක්ෂණ පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක මට්ටමේ පවතී. ලේබල්කරණ යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක වේ. සිවිලින් විදුලි පංකා බලශක්ති කාර්යක්ෂමතා ලේබලය පිළිබඳ මාධ්‍ය අන්තර්ගතය සකස් කර සීමිත ප්‍රචාරණයක් සිදු කරන ලදී.
පරිගණක සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණ වැඩසටහන ශීතකරණ සඳහා	පරිගණක සඳහා අනිවාර්ය ලේබල් කිරීම පිළිබඳ රෙගුලාසි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එය ප්‍රතික්ෂේප විණ. ස්වේච්ඡා වැඩසටහන අබණ්ඩව කරගෙන යනු ලැබේ.
බලශක්ති කාර්යක්ෂමතා ලේබල්කරණ වැඩසටහන	ශීතකරණ සඳහා ස්වේච්ඡා ලේබල්කරණ වැඩසටහන ආරම්භ කරන ලදී. සමාගම් 3ක් වැඩසටහනට සම්බන්ධ වී ඇත.
එල්.ඊ.ඩී. පහන් සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබලකරණ වැඩසටහන	එල්.ඊ.ඩී. පහන් සඳහා අනිවාර්ය අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් ලේබල් කිරීම ක්‍රියාත්මක කෙරේ.
කාමර වායු සමීකරණ යන්ත්‍ර	වායු සමීකරණ පරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කොරියානු රජය විසින් ප්‍රදානයක් අනුමත කරන ලදී. කාමර වායු සමීකරණ යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම සිදු වෙමින් පවතී.
රූපවාහිනී, බත් පිසින සහ මේස විදුලි පංකා/ පාදස්තලය සහිත විදුලි පංකා	මෙම උපකරණ සඳහා බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් සකස් කිරීම සිදු වෙමින් පවතී. එම උපකරණ සඳහා අදාළ මිණුම් සලකුණු තීරණය කිරීම සඳහා පරීක්ෂණ සිදු කර ඇත. පාදස්තලය සහිත විදුලි පංකා සහ බිත්ති විදුලි පංකා සඳහා ප්‍රමිතීන් සැකසීම සිදු කෙරෙමින් තිබේ.
විදුලි මෝටර	විදුලි මෝටර සඳහා කෙටුම්පත් ප්‍රමිතීන් සංශෝධනය කිරීම අවසන් කරන ලදී.

වායු සමීකරණ ලේබල් කිරීමේ වැඩසටහනේ අනාගත ගමන් මඟ පිළිබඳව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකා සහ කොරියා ආනයන, සැපයුම් සහ අනෙකුත් පාර්ශව ආයතන වෙත උපදෙස් ලබා දුන්නේ ය. එම උපදෙස් ලබාදීම සිදු කෙරුණේ පහත අරමුණු සහිතව ය:

- අනාගත ලේබල්කරණ වැඩසටහන පිළිබඳව කාමර වායු සමීකරණ ආනයනකරුවන් සහ සැපයුම්කරුවන් දැනුවත් කිරීමට සහ සහභාගීවන්නන් 100 දෙනෙකුගෙන් අයදුම් පත් ලබාගැනීමට.
- කාමර වායු සමීකරණ සඳහා වන ප්‍රමිතිය සහ අදාළ පරීක්ෂණ පහසුකම් පිළිබඳව ආනයනකරුවන් සහ සැපයුම්කරුවන් දැනුවත් කිරීමට.
- පාර්ශවකාර රාජ්‍ය ආයතන දැනුවත් කිරීමට සහ කාමර වායු සමීකරණ යන්ත්‍ර සඳහා සැලසුම් කර ඇති ලේබල්කරණ වැඩසටහනට ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට.





රූපය 03: 2022 දෙසැම්බර් 08 වන දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පැවැති වැඩමුළුව

4.2.1 බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වන මාර්ගෝපදේශ

බලශක්ති කාර්යක්ෂම සහ තිරසාර ගොඩනැගිලි ශ්‍රී ලංකාවේ ඉදිකිරීම සහතික කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂම ගොඩනැඟිලි සඳහා වූ කාර්ය සංග්‍රහය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තාක්ෂණික දියුණුව සහ අවශ්‍යතාවන්ට අනුකූලව ගොඩනැඟිලි ඉඳි කිරීමට හැකි වන පරිදි බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්ය සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ සහ නිතිපතා යාවත්කාලීන කිරීමේ වගකීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය දරයි. බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්ය සංග්‍රහය සම්බන්ධයෙන් වන ප්‍රගතිය මෙසේ ය.

සංශෝධනය සහ මහජන අදහස් සමාලෝචනය: අවශ්‍ය යාවත්කාලීන ඇතුළත් කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්යය සංග්‍රහය සංශෝධනයට ලක් විය. මෙම සංශෝධන දෙවන මහජන සමාලෝචනයක් සඳහා ඉදිරිපත් කරන ලදී. එය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ සහ විශේෂඥයින්ගේ ප්‍රතිපෝෂණ සහ යෝජනා සඳහා ඉඩ ලබා දී ඇත.

ලේඛනය සකසා අවසන් කිරීම සහ මුද්‍රණය කිරීම: මහජන අදහස් සමාලෝචනය මත පදනම් වූ සංශෝධන ඇතුළත් කිරීමෙන් පසුව, බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්ය සංග්‍රහ ලේඛනය සකසා අවසන් කරන ලදී. අවසන් කරන ලද සංස්කරණය, බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ පුළුල් මාර්ගෝපදේශයක් ලෙස සැලකෙයි. පසුව, අදාළ පාර්ශවකරුවන්ට සහ වෘත්තිකයන්ට බෙදා හැරීම සඳහා එය මුද්‍රණය කරන ලදී.

නියාමන සහ ක්‍රියාත්මක කිරීමේ රාමුව: බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්ය සංග්‍රහය ප්‍රකාශනයට සමගාමීව, නියාමන සහ ක්‍රියාත්මක කිරීමේ රාමුවක් සැකසීම කෙරෙහි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අවධානය යොමු විණ. ඉදිකිරීම් ක්‍රියාවලියේදී බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්ය සංග්‍රහයට ඵලදායී ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා කාර්ය පටිපාටි, මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් මෙම රාමුව මඟින් දක්වා ඇත.

පුහුණුව සහ ලියාපදිංචිය: ධාරිතාව හා අනුරූපණ ගොඩනැඟීම වැඩි දියුණු කිරීම සහ බලශක්ති කාර්යක්ෂම ගොඩනැඟිලි සැලසුම් සැකසීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ගොඩනැඟිලි සේවා ඉංජිනේරුවරුන්ට සහ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්ය මණ්ඩලයට පුහුණු වැඩසටහනක් පැවැත් විය. ගොඩනැගිලි අනුරූපණ මෘදුකාංග භාවිතයට, ගොඩනැගිලිවල බලශක්ති කාර්යක්ෂමතාව විශ්ලේෂණය කිරීමට සහ ප්‍රශස්ත මට්ටමට පැමිණවීමට වෘත්තිකයන්ට දැනුම ලබාදීම මෙම පුහුණුවට ඇතුළත් විණ. මෙයට අමතරව, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් ගොඩනැගිලි අනුරූපණයට සම්බන්ධ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කරන ලදී. සුදුසුකම් ලත් වෘත්තිකයෝ ඔවුන්ගේ විශේෂඥතාවය ඊට ලබා දෙන බවට සහතික වූහ.

පරිශීලක මාර්ගෝපදේශ සහ යෙදුම් ආකෘති: බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්යය සංග්‍රහය ඵලදායී ලෙස අවබෝධ කර ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට පාර්ශවකරුවන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පරිශීලක මාර්ගෝපදේශ සහ යෙදුම් ආකෘති නිර්මාණය කර ඇත. මෙම සම්පත් ප්‍රායෝගික මඟ පෙන්වීමක් සපයන අතර එමඟින් කාර්ය සංග්‍රහයේ අවශ්‍යතාවලට අනුකූල ප්‍රමිතිය ලබා දෙයි.

බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වූ කාර්ය සංග්‍රහය අඛණ්ඩව යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම මඟින් බලශක්ති කාර්යක්ෂමතාව, තිරසාර ඉදිකිරීම් භාවිතය සහ පරිසර හිතකාමී ගොඩනැගිලි සංවර්ධනය ශ්‍රී ලංකාවෙහි ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි අරමුණයි. මෙම කාර්යය සංග්‍රහයෙන් ශිල්පීන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින අනෙකුත් වෘත්තිකයන්ට සවිස්තරාත්මක ලෙස තොරතුරු ඉදිරිපත් කෙරෙයි. බලශක්ති කාර්යක්ෂම සහ පාරිසරික වශයෙන් වගකිව යුතු ගොඩනැගිලි ඉදිකිරීමට ඔවුන්ට එය උපකාරයක් වේ.

4.3 සමීක්ෂණ සහ පර්යේෂණ

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සමීක්ෂණ සහ පර්යේෂණ ක්ෂේත්‍රය මඟින් සිදු කෙරෙන්නේ, සියලු අංශවල බලශක්ති කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය බලශක්ති වැඩසටහන්වල ප්‍රතිපත්තිමය ගැටලු, බාධක සහ අවහිරතාවන් හඳුනාගැනීම සඳහා විවිධ විමර්ශන සහ අධ්‍යයනයන්හි සක්‍රීයව නිරත වීමයි. 2022 වසරේදී සිදු කරන ලද සමීක්ෂණ සහ පර්යේෂණ ක්‍රියාකාරකම් කිහිපයක් මෙහි දැක් වේ:

සිසිලන යන්ත්‍ර (Chiller) සම්ක්ෂණය

සිසිලන යන්ත්‍ර සම්ක්ෂණය පැවැත්වීම සඳහා උපදේශන සේවාවන් ලබා ගැනීම ප්‍රසම්පාදන කටයුතු සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සිදු කරන ලදී. තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් ක්‍රියාවලිය අවසන් වී ඇති අතර, කොන්ත්‍රාත්තුව කර්මාන්ත සේවා කාර්යංශය - කුරුණෑගල වෙත ලබා දෙන ලදී. ව්‍යාපෘතිය සඳහා සහයෝගිතා අරමුදල් ලබා ගැනීමට ජාතික ඕසෝන් ඒකකය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, තොරතුරු හුවමාරු කර ගැනීම සහ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරිණ. උපදේශන සේවා සමාගම සමඟ ගිවිසුම කෙටුම්පත් කිරීම මේ වන විට අවසන් වෙමින් පවතී. සම්ක්ෂණය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

පියැසි මත සූර්යය විදුලි පද්ධති ඉඳි කරගත් පාරිභෝගිකයන්ගේ ප්‍රතිචාර පිළිබඳ සම්ක්ෂණය: පියැසි මත සූර්ය විදුලි පද්ධති ඉඳි කරගත් පාරිභෝගිකයන්ගේ විදුලි පරිභෝජන රටාවන් සහ සූර්යවිදුලි පද්ධති සම්බන්ධ ඔවුන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කිරීම පිළිබඳ සම්ක්ෂණය සඳහා මූලික ප්‍රශ්නාවලියක් සකස් කර සමාලෝචනය කරන ලදී. සම්ක්ෂණය පැවැත්වීමේදී අවශ්‍ය වන සහාය ලබා ගැනීමට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සිය සමඟ සාකච්ඡා කරමින් පවතී.

කාර්යක්ෂම ශීතකරණ වැඩසටහන: කාර්යක්ෂම ශීතකරණ වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් සිදුවෙමින් පවතී. පාර්ශවකරුවන් දැනුවත් කිරීම සහ ඔවුන්ට මගපෙන්වීම ලබා දීම සඳහා පත්‍රිකා මුද්‍රණය කිරීම සහ මෙහෙයුම් මාර්ගෝපදේශ සැපයීම යන ක්‍රියාකාරකම් මේ වනවිට සිදු කෙරේ.


විදි ආලෝකකරණය සඳහා සුදුසු තාක්ෂණයන් පිළිබඳ අධ්‍යයනය: ආලෝකකරණය සඳහා සුදුසු තාක්ෂණයන් පිළිබඳ අධ්‍යයනයක් ලංකා විදුලි බල සමාගම සමඟ එක්ව ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශයේ ආරම්භ කරන ලදී. අධ්‍යයනයේ කොටසක් ලෙස, යෝජිත නිර්දේශ මත පදනම්ව නුගේගොඩ සුපිරි වෙළෙඳ පොළ ප්‍රදේශයේ වීදි ලාම්පු ආදේශනයන් සවිකිරීම ලංකා විදුලිබල සමාගම අරඹා ඇත.

තේ දලු මැලවීම සඳහා භාවිත කරන වියලන වැඩි දියුණු කිරීම: රේඩියේටරයක් සහිත උණුසුම් වායු සැපයුම් පද්ධතියකින් සමන්විත උක්ත වියලනයෙහි කාර්යක්ෂමතාව මැන බැලීම සහ තක්සේරු කර බැලීම තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේදී සිදු කරන ලදී. තේ කර්මාන්තයේ සිදුවන තේ දලු මැලවීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. ශ්‍රී ලංකාවේ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම උදෙසා දත්ත ඒකරාශී කිරීම, වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඵලදායී ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම සඳහා මෙම සම්ක්ෂණ සහ පර්යේෂණ ක්‍රියාකාරකම් අවශ්‍ය වේ. මෙම අධ්‍යයනයන්හි සොයාගැනීම් සහ නිර්දේශ රටෙහි තිරසාර බලශක්ති මූලාරම්භයන් අබණ්ඩව වැඩිදියුණු කිරීමට සහ සංවර්ධනයට දායක වනු ඇත.

4.4 බලශක්ති තොරතුරු කළමනාකරණය

බලශක්ති කළමනාකරණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා බලශක්ති දත්ත සහ තොරතුරු බෙදා හැරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. බලශක්ති තුලනය ඇතුළු වාර්ෂික බලශක්ති තොරතුරු ප්‍රකාශයට පත් කිරීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි මැදිහත්වීමෙන් සිදුවන වැදගත් අංගයකි. බලශක්ති දත්ත ප්‍රකාශනය පිළිබඳ යාවත්කාලීන කිරීම් කිහිපයක් මෙසේ ය.

ශ්‍රී ලංකා බලශක්ති තුලනය 2019 ප්‍රකාශයට පත් කරන ලද අතර 2020 පොත මුද්‍රණයේ අවසන් අදියරේ පවතියි. 2021 බලශක්ති තුලනය පොත් පිංච සඳහා සියලු දත්ත සකසා තිබේ. පාර්ශවකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පර්යේෂකයන් සඳහා බලශක්ති ශේෂ වාර්තා ප්‍රකාශයට පත් කිරීම ඉතා වැදගත් වේ. ඒ, එය බලශක්ති තත්ත්වය තක්සේරු කිරීමට, ප්‍රවණතා හඳුනා ගැනීමට සහ තිරසාර බලශක්ති කළමනාකරණය සඳහා උපාය මාර්ග සකස් කිරීමට බෙහෙවින් උපකාරී වන බැවිනි. බලශක්ති ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය අවබෝධ කර ගැනීමට සහ බලශක්ති සැලසුම්කරණය, ප්‍රතිපත්ති සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ ආයෝජන සම්බන්ධයෙන් දැනුවත් තීරණ ගැනීමට එය වටිනා සම්පතකි.



සටහන 04: "Energy Balance" නැමැති පොත 2019 වසරේදී පළ කිරීම

4.5 ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය

කොවිඩ් වසංගතය හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක තත්වයන් නොසලකා 2022 වසරේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියන් සහ සිසුන් සම්බන්ධ කර ගනිමින් විවිධ ප්‍රචාරණ සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදු කළේ ය. එහි විශේෂ අවස්ථා කිහිපයක් මෙසේ ය.

විද්‍යා විෂය ඉගැන්වීම වැඩිදියුණු කිරීම: විද්‍යා විෂය ඉගැන්වීම වඩාත් ශිෂ්‍ය කේන්ද්‍රීය සහ අන්තර් ක්‍රියාකාරී මට්ටමට රැගෙන ඒමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ජාතික අධ්‍යාපන ආයතනයට යෙදවුම් ලබා දුන්නේය. සිසුන් අතර බලශක්ති සම්බන්ධ සංකල්ප පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන මෙම පියවර ගන්නා ලදී.

සුළං බලය පිළිබඳව කාටූනයක් නිර්මාණය කිරීම: පෙර පාසල් දරුවන් ඉලක්ක කර ගනිමින් සුළං බලශක්තිය පිළිබඳ කාටූනයක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය නිෂ්පාදනය කළේ ය. ළමා මනසට පුනර්ජනනීය බලශක්ති සංකල්පය ආකර්ශනීය ආකාරයෙන් මෙන්ම ප්‍රවේශ කළ හැකි ස්වරූපයකින් එම සජීවීකරණ අන්තර්ගතය හඳුන්වා දීම අරමුණ විණ.

බලශක්ති කාර්යක්ෂම ඉවුම් පිහුම් පිළිබඳව වීඩියෝ ඉදිරිපත් කිරීම: බලශක්ති කාර්යක්ෂම ආහාර පිසීමේ ක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින් වීඩියෝ නිෂ්පාදනය කිරීම ද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූලිකත්වයෙන් සිදු කෙරිණ. දෛනික ඉවුම් පිහුම් පිළිවෙත්වලදී බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම එහි අරමුණ වූයේ ය.

ත්‍රෛමාසික සංරක්ෂා සඟරාව: ත්‍රෛමාසික "සංරක්ෂා" සඟරාවේ වෙළුම් හතරක් ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට හැකි විණ. තිරසාර බලශක්තියට සම්බන්ධ විවිධ මාතෘකා ආවරණය කෙරෙන මෙම සඟරාවෙන් පාඨකයන්ට වටිනා තොරතුරු සහ තීක්ෂ්ණ බුද්ධිය ලබා දෙයි.

තිරසාර බලශක්තිය පිළිබඳ වීඩියෝ: තිරසාර බලශක්තිය පිළිබඳව දැනුම ඉස්මතු කරන වීඩියෝවක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නිෂ්පාදනය කර නිකුත් කරන ලදී. මෙයට අමතරව, පුනර්ජනනීය බලශක්ති අංශයේ වෘත්තීය අවස්ථා ප්‍රවර්ධනය කරමින් පාසල් හැර යන අය සූර්ය බලශක්ති කර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමේ අරමුණින්, සූර්ය බලශක්තිය පිළිබඳ වාර්තාමය වැඩසටහනක් ද නිර්මාණය කරන ලදී.

සුළං බලය පිළිබඳව මාර්ග ගත සම්මන්ත්‍රණයක් පැවැත්වීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සුළං බලය පිළිබඳව මාර්ග ගත සම්මන්ත්‍රණයක් සාර්ථකව පවත්වන ලදී. එයට සහභාගීවූවන්ට ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සුළං බලය පිළිබඳව ඉගෙන ගැනීමටත්, ඔවුන් සමඟ සම්බන්ධ වීමටත් එය වේදිකාවක් වූයේ ය. සුළං බලශක්ති තාක්ෂණයන් සහ ඒවායේ විභව ප්‍රතිලාභ පිළිබඳ දැනුම වැඩි කිරීම මාර්ග ගත මෙම සම්මන්ත්‍රණයෙහි අරමුණ විය.

මාධ්‍යවේදී පුහුණු වැඩසටහන: බලශක්තිය සහ පරිසරය පිළිබඳ මාධ්‍යවේදීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ආරම්භ කළේ ය. මාධ්‍යවේදීන්ගේ දැනුම සහ වාර්තාකරණ කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන මෙම වැඩසටහන ආරම්භ කෙරිණ. බලශක්තිය සහ පාරිසරික මාතෘකා ඵලදායී ලෙස ආවරණය කිරීමට ඔවුන්ට පුහුණුව ලබා දෙන ලදී.

බලශක්ති සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්: ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් විවිධ ආයතන සඳහා බලශක්ති සංරක්ෂණය, බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම සහ වගකීම් සහිත බලශක්ති පරිභෝජනය පිළිබඳ වැඩසටහන් පවත්වා දිරිගැන්වීම් කරන ලදී.

ශ්‍රී ලංකාවේ පුරවැසියන් සහ සිසුන් දැනුවත් කිරීම සඳහා ඔවුන්ව සම්බන්ධ කර ගනිමින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වැඩසටහන් මේ අන්දමට රැසක් පවත්වා ඇත. එම වැඩසටහන් තිරසාර බලශක්ති භාවිතයන් සහ තාක්ෂණයන් පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය පෝෂණය කිරීම උදෙසා පවත්වන ලද වැඩසටහන් ය. මෙම ප්‍රචාරණ සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සපුරාලමින් අධිකාරිය ඉතා වැදගත් කාර්යභාරයක් සිදුකර තිබේ.

4.6 අරමුදල් සම්පාදනය

ලෝක බැංකුව සහ හරිත දේශගුණික අරමුදල සපයන මූල්‍ය ආධාරවලට අමතරව, ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විවිධ සම්පත් එක්රැස් කිරීමේ ප්‍රයත්නයන් සිදු කර ඇත.

මේ සම්බන්ධයෙන් සිදු කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් මෙසේ ය:

සුනිත්‍ය බලශක්ති අරමුදල සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ:
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සුනිත්‍ය බලශක්ති අරමුදල සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලදී. අරමුදල ඵලදායී කළමනාකරණය කිරීම සඳහා සහ භාවිතය කිරීම සඳහා මෙය මාර්ගෝපදේශ රාමුවක් ලෙස ක්‍රියා කරයි. නිසි පරිදි ක්‍රියාත්මක වන සහ බලපෑම් සහගත තිරසාර බලශක්ති ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන්කෙරෙන බව එමඟින් සහතික කෙරේ.

සෙස් බද්ද සඳහා කැබිනට් සංදේශය:
ෆොසිල ඉන්ධන ආනයනය සඳහා බද්දක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2022 ජූලි මාසයේදී කැබිනට් සංදේශයක් ඉදිරිපත් කරන ලදී. පිවිතුරු හා වඩාත් තිරසාර බලශක්ති භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති ක්ෂේත්‍රයට සංවර්ධන මූල්‍ය යොමු කිරීම මෙම සෙස් බද්දෙහි අරමුණයි. එය තිරසාර බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදීත්, අනාගතයේදී ශ්‍රී ලංකාව හරිත සහ බලශක්ති කාර්යක්ෂම අනාගතයක් කරා සංක්‍රමණය වීමට දරන ව්‍යායාමයේදීත්, ණය මාර්ග තහවුරු කර ගැනීම සහ මාර්ගෝපදේශ හා ප්‍රතිපත්ති රාමු ස්ථාපනය කිරීම වැනි සම්පත් එකතු කිරීමේ උත්සාහයන් තීරණාත්මක සාධකයක් ලෙස ක්‍රියාකරයි.

5.0 ගැටළු

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති සංරක්ෂණය හා කළමනාකරණය සංවර්ධනය කිරීමේදී මුහුණ දෙන ගැටළු රැසක් තිබේ.

මූල්‍ය බාධක:
ප්‍රමාණවත් මූල්‍ය සම්පත් සඳහා ප්‍රවේශය නොමැතිවීම සහ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ භාවිතයේදී සැලකිය යුතු තරම් ඉහළ පෙර වියදම් දැරීමට සිදුවීම අභියෝගාත්මක තත්ත්වයකි. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම සඳහාත් බලශක්ති කාර්යක්ෂමතා පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහාත් සැලකිය යුතු තරමේ ආයෝජන අවශ්‍ය වේ. මෙම බාධකය ජය ගැනීම සඳහා යෝග්‍ය මූල්‍යකරණ විකල්පයන් තිබීම ඉතා වැදගත් වේ.

ඉඩම් සම්පත්:
ඉඩම් අයිතිය සම්බන්ධයෙන් පවතින තත්ත්වය නිසා ඕනෑ ම යටිතල පහසුකම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ඉතා අසීරු වී ඇත. ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවෙන් වැඩි කොටසක් ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයන් සඳහා වැය කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස විශාල ප්‍රමාදයක් ද වැඩි පිරිවැයක් ද දරන්නට සිදු වේ. ඉඩම් ගැටළු නිරාකරණය කර ගැනීමට ආයෝජකයින්ට ඉඩ සලසා ඇති වර්තමාන ක්‍රමය හේතුවෙන් පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහන්වලින් වැඩි ප්‍රගතියක් බලාපොරොත්තු විය නොහැකි තත්ත්වයක් මතු වී ඇත.

ප්‍රතිපත්ති සහ නියාමන රාමුව:
ප්‍රමාණවත් නොවන හෝ නොගැළපෙන ප්‍රතිපත්ති සහ රෙගුලාසි පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිවල සංවර්ධනයට බාධාවක් විය හැකි ය. නොපැහැදිලි මාර්ගෝපදේශ, දිගු අනුමත ක්‍රියාවලීන් සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා පවත්නා සීමිත දිරිගැන්වීම් ආයෝජකයින්ට සහ සංවර්ධකයින්ට බාධාවක් වීමට පුළුවන.

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ජාතික පද්ධතියට සම්බන්ධ කිරීම සහ යටිතල පහසුකම්:
ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සම්බන්ධ කිරීම සංකීර්ණ විය හැකි ය. මේ ගැටලුව මතුවන්නේ සූර්ය සහ සුළං වැනි අස්ථාවර බලශක්ති ප්‍රභවයන් නිසයි. ස්ථාවර සහ විශ්වාසනීය විදුලි සැපයුමක් සහතික කිරීම උදෙසා පුනර්ජනනීය බලශක්ති උත්පාදනයට පහසුකම් සලසමින් ජාතික පද්ධතියේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම වැදගත් ය.

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ

මහජනතාව දැනුවත් කිරීම සහ පිළිගැනීම:
පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳව සාමාන්‍ය ජනතාවට දැනුවත්භාවය සහ අවබෝධය අඩුකම ඒවායෙහි ප්‍රගතියට බාධාවක් විය හැකි ය. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ හා බලශක්ති සංරක්ෂණයේ ප්‍රතිලාභ සහ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සහ ඒ පිළිබඳව අධ්‍යාපනය ලබාදීම, මහජන සහයෝගය සහ සහභාගීත්වය පෝෂණය කිරීමට ඉතා වැදගත් වේ.

කාර්මික සහ තාක්ෂණික අභියෝග:
පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා උසස් තාක්ෂණයන් සහ ප්‍රවීණත්වය අවශ්‍ය වේ.

නවතම ප්‍රගතීන් සමඟ කටයුතු කිරීම, තාක්ෂණික බාධාවන් පිළිබඳව කටයුතු කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ නිපුණතාව සහිත වෘත්තිකයන් සිටීම සහතික කිරීම අඛණ්ඩ අභියෝග ලෙස සැලකෙයි.

ක්‍රියාකාරී සැලැස්ම 2023

පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහන්

- පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීම
- පුනර්ජනනීය බලශක්ති සම්පත් ඇගයීම
- බලශක්ති උද්‍යාන ක්‍රියාත්මක කිරීම
- ශක්‍යතා අධ්‍යයනය, පාරිසරික බලපෑම් තක්සේරුව, සමාජ බලපෑම් තක්සේරුව, ඉඩම් ලබා ගැනීමේ වැඩපිළිවෙල සැකසීම යනාදිය සිදු කිරීම.
- සූර්ය බල සංග්‍රාමය වැඩසටහන
- මාර්ග ගත පද්ධතියක් භාවිතයෙන් සේවා සපයන්නන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම
- පුහුණු වැඩසටහන් සහ අනෙකුත් අවශ්‍ය ධාරිතාවන් ගොඩනැගීමට මැදිහත්වීම්
- බලශක්ති බලපත්‍ර නිකුත් කිරීම මගින් පුනර්ජනනීය බලශක්ති ක්‍රියාවලිය සඳහා සම්පත් වෙන් කිරීම.
- පුනර්ජනනී බලශක්ති ක්ෂේත්‍රයේ ධාරිතා ගොඩනැගීම සඳහා යුරෝපා සංගමයේ සහාය ඇති ශ්‍රී ලංකා පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණ වැඩසටහන්

- බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සහ බලශක්ති ක්ෂේත්‍රයේ වෘත්තිකයන් පුහුණු කිරීමට අදාළ වන පුහුණු සංග්‍රහ සඳහා නියාමන සහ ක්‍රියාත්මක කිරීමේ රාමුව සැකසීම
- ගොඩනැගිලි අනුරූපණ ගොඩනැගීම සහ උපදේශකයින් සඳහා සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම
- බලශක්ති පරිභෝජන මිණුම් සලකුණු ස්ථාපිත කිරීම
- බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන් සහ බලශක්ති සේවා සපයන සමාගම් මගින් ආයතනවල බලශක්ති කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රතිපත්ති හිදැස්, බාධක සහ ශ්‍රී ලංකාවේ සියලුම අංශවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ සහ පුනර්ජනනී බලශක්ති සංවර්ධන වැඩසටහන් සඳහා ඇති බාධා පිළිබඳ වාර්තාව
- අනිවාර්ය පදනම මත ශීතකරණය සඳහා බලශක්ති කාර්ය සාධන ලේබලය සහ ස්වේච්ඡා පදනම මත එල්.ඊ.ඩී මොඩියුල ක්‍රියාත්මක කිරීම
- සිසිලන යන්ත්‍ර (chiller) සමීක්ෂණය, ඉන්වෙන්ටරි සකස් කිරීම සහ අකාර්යක්ෂම සිසිලන යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීම මගින් බලශක්ති ඉතිරිකිරීමේ හැකියාව හඳුනා ගැනීම.
- වීදි ආලෝකකරණය සඳහා සුදුසු තාක්ෂණයන් පිළිබඳ අධ්‍යයනය
- බලශක්ති අධ්‍යාපන සහ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම



මූල්‍ය තොරතුරු



අදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය *2022 දෙසැම්බර් 31ත් අවසන් වූ වසර සඳහා*	සටහන්	2022 රු	2021 ප්‍රතිප්‍රකාශිත රු
ආදායම			
මෙහෙයුම් ආදායම	3	375,890,133	415,320,237
මෙහෙයුම් නොවන ආදායම	4	309,293,525	61,360,718
මුළු ආදායම		**685,183,658**	**476,680,955**
වියදම්			
ව්‍යාපෘති / ක්‍රියාකාරකම් මුදල්	5		
පුනර්ජනනීය බලශක්ති	5.1	103,141,753	17,214,942
දැනුම කළමනාකරණය	5.2	5,268,601	4,035,074
උපාය මාර්ගික ක්‍රියාකාරකම්	5.3	60,341,022	7,007,929
සම්පත් අනුරූපණය	5.4	20,598,578	10,871,558
පර්යේෂණ සහ සංවර්ධන	5.5	12,355,743	15,723,800
ප්‍රභව සංවර්ධනය සහ පහසුකම් සැපයීම	5.6	518,685	1,757,397
පද්ධති සහ සැලසුම්	5.7	4,329,181	859,592
කාර්මික හා සේවා අංශය	5.8	2,225,510	473,243
ගෘහ හා කෘෂි අංශය	5.9	1,866,874	1,577,808
සමීක්ෂණ හා පර්යේෂණ	5.10	176,079	885,336
ප්‍රතිපත්ති සහ උපදේශන සේවා	5.11	807,465	3,223,965
තොරතුරු කළමනාකරණ තාක්ෂණය	5.12	525,787	-
		212,155,278	**63,630,644**
පුනරාවර්තන වියදම්	6		
වැටුප් සහ දීමනා	6.1	121,023,862	104,993,727
ගමන් වියදම් සහ සංයුක්ත දීමනා	6.2	720,244	2,829,577
සැපයුම්	6.3	8,421,344	8,290,995
නඩත්තු වියදම්	6.4	21,125,019	11,290,862
කොන්ත්‍රාත් සේවා	6.5	30,925,519	45,578,404
ක්ෂය වියදම්	6.6	54,136,931	48,332,862
වෙනත් පුනරාවර්තන වියදම්	6.7	10,802,421	9,926,155
		247,155,340	**231,242,582**
මුළු වියදම		**459,310,618**	**294,873,226**
අතිරික්තය / (ඌනතාවය)		**225,873,040**	**181,807,729**

පිටු අංක 35 සිට 42 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 43 සිට 62 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. නිවැරදි බවට සහතික කරන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)

අධ්‍යක්ෂ ජෙනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික

සභාපති

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය *2022 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා*	සටහන්	2022 රු	2021 ප්‍රතිප්‍රකාශිත රු
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	10		
නිදහස් වත්කම්	10.1	451,021,093	486,783,687
කල්බදුමය වත්කම්	10.2	34,392,340	35,920,888
අස්පෘශ්‍ය වත්කම්	11	2,466,077	3,092,770
නොනිමි කාර්යය	12	134,298,595	121,609,494
ආයෝජන	13	800,767,372	68,033,522
මුළු ජංගම නොවන වත්කම්		**1,422,945,477**	**715,440,361**
ජංගම වත්කම්			
ලැබිය යුතු දෑ	14	47,386,145	18,571,091
වෙනත් ජංගම වත්කම්	15	104,539,836	50,502,303
මුදල් සහ මුදල්වලට සමාන දෑ	16	20,846,161	586,693,911
මුළු ජංගම වත්කම්		**172,772,142**	**655,767,305**
එකතුව වත්කම්		**1,595,717,619**	**1,371,207,666**
හිමිකම් සහ බැරකම්			
හිමිකම්			
සමුච්චිත අරමුදල	17	22,100,336	22,100,336
ශුද්ධ අතිරික්තය /(ඌනතාව)		563,713,058	389,404,156
විලම්බිත ප්‍රදානය	18	268,709,286	303,534,570
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	20	412,442,884	367,557,695
සුනිත්‍ය ඇප අරමුදල		127,448,945	120,769,996
ප්‍රත්‍යාගණන සංචිතය		101,217,000	101,217,000
මුළු හිමිකම්		**1,495,631,509**	**1,304,583,753**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂිත ප්‍රතිදාන		39,001,758	36,309,505
මුළු ජංගම නොවන වගකීම්		**39,001,758**	**36,309,505**
ජංගම වගකීම්			
ගෙවිය යුතු වෙනත් දෑ	19	56,785,917	24,720,509
ඉඩම් අත්පත් කර ගැනීමේ ශුද්ධ තැන්පතු		4,298,435	5,593,899
මුළු ජංගම වගකීම්		**61,084,352**	**30,314,408**
මුළු හිමිකම් සහ වගකීම ප්‍රමාණය		**1,595,717,619**	**1,371,207,666**

පිටු අංක 35 සිට 42 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 43 සිට 62 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. නිවැරදි බවට සහතික කරන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)

අධ්‍යක්ෂ ජෙනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික

සභාපති

ප්‍රාග්ධන වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

ප්‍රාග්ධන වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය *2022 දෙසැම්බර් 31ත් අවසන් වූ වසර සඳහා*	සමුච්චිතයි අරමුදල	ශුද්ධ අතිරික්තය / හිඟය	විලම්බිත ප්‍රදාන	නැවත ප්‍රත්‍යාගණන කිරීමේ සංචිත	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	සුනිත්‍ය බලශක්ති ඇපකාර අරමුදල	එකතුව
31.12.2019 වන දිනට ප්‍රකාශ කරන ලද ශේෂය	**22,100,336**	**174,575,877**	**377,274,934**	**101,217,000**	**370,902,975**	**107,419,486**	**1,153,490,608**
පෙර වසරට ගැළපීම්		(93,915)					(93,915)
2020 වර්ෂය සඳහා වැඩිවීම්/(අඩුවීම්)		43,119,645	(38,418,410)				4,701,235
ඇපකාර මුදලට මාරු කිරීම		(8,476,059)				8,476,059	-
බලශක්ති අරමුදලට මාරු කිරීම-ආදායම්		(19,817,444)			19,817,444		-
බලශක්ති අරමුදලට මාරු කිරීම-ව්‍යාපෘති වියදම් ඉඩම් ප්‍රත්‍යාගණනය		5,658,846			(5,658,846)		-
2020.12.31 වන දිනට ශේෂය	**22,100,336**	**194,966,950**	**338,856,524**	**101,217,000**	**385,061,623**	**115,895,545**	**1,158,097,978**
2021 වසර සඳහා වැඩිවීම/(අඩුවීම)		181,807,729	(35,321,954)				146,485,775
ඇපකාර අරමුදලට මාරු කිරීම		(4,874,451)				4,874,451	-
බලශක්ති අරමුදලට මාරු කිරීම-ආදායම		(43,855,379)			43,855,379		-
බලශක්ති අරමුදලට මාරු කිරීම-ව්‍යාපෘති වියදම් ඉඩම් ප්‍රත්‍යාගණනය		61,359,307			(61,359,307)		-
2021.12.31 වන දිනට ශේෂය	**22,100,336**	**389,404,156**	**303,534,570**	**101,217,000**	**367,557,695**	**120,769,996**	**1,304,583,753**
2022 වසර සඳහා වැඩිවීම/(අඩුවීම)		225,873,040	(34,825,284)				191,047,756
ඇපකාර අරමුදලට මාරු කිරීම		(6,678,949)				6,678,949	-
බලශක්ති අරමුදලට මාරු කිරීම-ආදායම		(240,820,185)			240,820,185		-
බලශක්ති අරමුදලට මාරු කිරීම-ව්‍යාපෘති වියදම් ඉඩම් ප්‍රත්‍යාගණනය		195,934,996			(195,934,996)		-
2022.12.31 වන දිනට ශේෂය	**22,100,336**	**563,713,058**	**268,709,286**	**101,217,000**	**412,442,884**	**127,448,945**	**1,495,631,509**

පිටු අංක 35 සිට 42 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 43 සිට 62 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. නිවැරදි බවට සහතික කරන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)　　අධ්‍යක්ෂ ජෙනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික　　සභාපති

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය *2022 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා*	සටහන්	2022 ප්‍රතිප්‍රකාශිත රු	2021 ප්‍රතිප්‍රකාශිත රු
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය			
වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය)		225,873,040	181,807,729
ගැලපීම්:			
අලාභ හා හානිවීම්		-	-
පොලිය ආදායම	4,9	(34,745,486)	(18,906,420)
ජලම්ගිත ක්‍රමික්ෂය ප්‍රදානය (ලැබුණු අරමුදල් සඳහා)	8	(34,825,292)	(35,321,954)
බලශක්ති අරමුදලෙන් මාරුකිරීම්		-	-
පාරිතෝෂිත දීමනා		3,569,503	2,481,573
පරිත්‍යාග (ඉඳුරාන ඉඩම)		(3,385,000)	-
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලැබෙන ලාභය		(4,375)	(2,658,970)
ක්ෂය වීම	6.6	54,136,931	48,332,862
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)		**210,619,321**	**175,734,820**
අනෙකුත් ජංගම වත්කම්වල (අඩුවීම)/(වැඩිවීම)		(68,246,983)	(14,330,252)
ජංගම වගකීම් (වැඩිවීම)/(අඩුවීම)		30,769,944	29,583,416
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද මුදල් ප්‍රවාහය		**173,142,282**	**190,987,984**
ගෙවන ලද පාරිතෝෂිත		(877,250)	(182,925)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**172,265,032**	**190,805,059**
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය			
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	10.1	(12,555,711)	(58,026,569)
අස්පෘශ්‍ය වත්කම්	11	(284,000)	(1,482,650)
නොනිමි කාර්යය	12	(12,689,101)	(48,211,897)
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	13	(732,733,850)	(4,507,110)
භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබීම		-	50,732,494
ලැබුණු පොළිය		20,139,880	18,539,078
ස්ථාවර වත්කම් බැහැර කිරීම්		10,000	2,658,970
		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහය		**(738,112,782)**	**(40,297,684)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහය			
විලම්බිත ප්‍රදානය			-
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල		-	-
සමුච්චිත අරමුදල		-	-
සුනිත්‍ය ඇප අරමුදල		-	-
විදේශීය පරිත්‍යාගශීලීන්ට ආපසු ගෙවිය යුතු ණය		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		-	-
මුදල් හා මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**(565,847,750)**	**150,507,375**
වසර ආරම්භයේදී මුදල් මුදල්වලට සමාන දේ	16	**586,693,911**	**459,993,159**
වසර අවසානයේදී මුදල් හා මුදල්වලට සමාන දේ		**20,846,161**	**586,693,911**

පිටු අංක 35 සිට 42 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 43 සිට 62 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.
නිවැරදි බවට සහතික කරන ලදී.

අධ්‍යක්ෂ (මූල්‍ය)

අධ්‍යක්ෂ ජෙනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වගකිව යුතු ය. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

මණ්ඩල සාමාජික

සභාපති

අයවැය සංසන්දනාත්මක ප්‍රකාශය සහ සත්‍ය මුදල් ප්‍රමාණයන් - 2022

2022 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා

	සටහන්	සත්‍ය 2022 රු	අයවැය 2022 රු	වෙනස 2022 රු
පෞද්ගලික පඩිනඩි				
වැටුප් සහ වේතන		65,185,149	65,417,288	232,139
EPF 12%		9,559,415	9,707,274	147,859
ETF 3%		2,420,705	2,482,670	61,965
අතිකාල සහ නිවාඩු දින දීමනා		6,560,968	6,774,718	213,750
අතුරු දීමනා		5,612,249	5,623,833	11,584
ජීවන වියදම		9,617,400	9,665,200	47,800
වෙනත් දීමනා		6,041,000	6,071,000	30,000
NAITA වැටුප		934,500	1,041,500	107,000
ගමනාගමන දීමනාව		5,400,000	5,400,000	-
ඉන්ධන දීමනාව		7,658,928	8,008,428	349,500
පාරිතෝෂික		1,182,370	1,400,000	217,630
		-	-	-
		120,172,684	**121,591,911**	
ගමන් වියදම්				
දේශීය		588,600	800,000	211,401
විදේශීය		67,591	100,000	32,409
		656,190	**900,000**	
සැපයුම් සහ අවශ්‍යතා				
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා		1,118,311	1,850,000	731,689
ඉන්ධන සහ ලිහිසි තෙල්		6,460,269	5,700,000	(760,269)
පුවත්පත්		123,870	250,000	126,130
නිල ඇඳුම්		287,477	400,000	112,523
		7,989,926	**8,200,000**	
අලුත්වැඩියා සහ නඩත්තු වියදම්				
දිනය திகதி Date 2023 නොවැම්බර් 30 දින



සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) පුනරීන් සූර්ය සහ සුළං බල ව්‍යාපෘතියට ඉඩම් අත්පත් කරගැනීමට අවශ්‍ය වන්දිගෙවීම් වෙනුවෙන් පුනරීන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණු රු.මිලියන 46.75 ක අත්තිකාරම් මුදලක් ව්‍යාපෘති වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පුනරින් ව්‍යාපෘතිය සඳහා පූර්ව වර්ෂවලදී අධිකාරිය දරා තිබුණු රු.මිලියන 23.7 ක සමීක්ෂණ ගාස්තු සහ ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන වියදම් ව්‍යාපෘති වියදම් ලෙස ගිණුම්ගත නොකර කෙරීගෙන යන වැඩ ලෙස

ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී හම්බන්තොට සූර්යබලාගාර ඉඩම වටා ඉදිකර තිබුණු විදුලි වැට තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) කුඩා ජල විදුලි බලාගාරයක් වෙනුවෙන් 2020 වර්ෂයේදී අධිකාරිය විසින් බදු දී තිබුණු රජයේ ඉඩමක් වෙනුවෙන් ලැබිය යුතු රු. 780,000 ක බදු මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 76 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු රු. මිලියන 150 ක් වූ මාස 6 සහ මාස 8 ස්ථාවර තැන්පතු 3 ක් ආයෝජන ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ජංගම නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 9 ඡේදය ප්‍රකාරව මුදල් හා මුදල් සමාන දෑ ලෙස ගිණුම්ගත කළ යුතු රු. මිලියන 130 ක් වූ මාස 3 ක ස්ථාවර තැන්පතු 3 ක් ආයෝජන ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ජංගම නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට ලැබී තිබුණු රු. මිලියන 191.32 ක බලශක්ති බලපත්‍ර ගාස්තු ආදායම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව බලපත්‍ර කාලපරිච්ඡේදය පුරා කාලීනව ආදායමට හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට පොත්වල අගය ශූන්‍ය වූ පිරිවැය රු. මිලියන 355 ක ස්ථාවර වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවති අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට පැවති අක්‍රීය උපකරණ අයිතම 263 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) අයදුම්කර තිබුණු මෙගා වොට් 700 ක පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා අධිකාරිය විසින් මෙගා වොට් 100 ක් සඳහා එනම් රු.මිලියන 30 ක් අඩුවෙන් ලියාපදිංචි ගාස්තු අයකර තිබුණි. මධ්‍යම ජාලයට සම්බන්ධ කල හැකි නියමිත ධාරිතාවය සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලය මඟින් තහවුරු කර නොතිබීම හේතුවෙන් එසේ ගාස්තු අඩුවෙන් අයකර තිබූ අතර අයවියයුතු ඉතිරි ලියාපදිංචි ගාස්තු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කිරීම් කර නොතිබුණි.

(ඔ) පුනරින් සූර්ය සහ සුළංබල ව්‍යාපෘතිය සහ මන්නාරම සුළංබල ව්‍යාපෘතිය (දෙවන අදියර) සඳහා අධිකාරිය විසින් 2017 වර්ෂයේ සිට දරා තිබුණු රු. මිලියන 261.7 ක වියදම් ප්‍රතිපූර්ණය කරවාගැනීම සඳහා අධිකාරිය විසින් 2022 නොවැම්බර් 8 දින අදාල ව්‍යාපෘතිවල සංවර්ධකයා වූ ඉන්දියානු සමාගම වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රතිපූර්ණය කර නොතිබුණි. තවද

වියදම් ප්‍රතිපූර්ණය සම්බන්ධයෙන් අදාල සමාගම සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබූ අතර අධිකාරිය විසින් උක්ත ව්‍යාපෘති වෙනුවෙන් දරා තිබූ වියදම් සඳහා ලැබිය යුතු මුදල් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව්කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ අභිමතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලිකිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද මෙම වාර්තාවේ 1.2 (උ), (ඌ) හා (එ) ඡේදයන්වල සඳහන් නිර්දේශ හැර සෙසු නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 5 (ඔ) වගන්තිය	අධිකාරිය විසින් ලබැඳියාව අතර ගැටුම් (conflict of interest) නිර්මාණය වන අයුරින් මෙගා වොට් 21.3 ක බලාගාර 5 ක් සඳහා අධිකාරිය නමින් බලශක්ති බලපත්‍ර නිකුත්කර තිබුණි. තවද ව්‍යාපෘති 03ක් සඳහා රු.මිලියන 1.6 ක අයදුම්පත් ගාස්තු සහ මෙගාවොට් 10 ක එක් ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 5.75 ක බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) II පරිච්ඡේදයේ 1.2 වගන්තිය	අධිකාරියේ අනුමත තනතුරක් නොවන බංගලා භාරකරු තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පුද්ගලික සමාගමක් හරහා කොන්ත්‍රාත් පදනම මත සේවකයෙකු බඳවාගෙන ඔහු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 913,239 ක් වැටුප් සහ අතිකාල ලෙස ගෙවා තිබුණි.
(ii) XXXIII පරිච්ඡේදයේ 1.4 වගන්තිය	අධිකාරිය විසින් ඉඩම් බදු දීම් සඳහා වන බදු ඔප්පුවේ කෙටුම්පත් පිළියෙල කිරීම සඳහා නීතිපතිවරයා වෙත කරනු ලබන ඉල්ලීම් සමඟ අමාත්‍යවරයා අනුමත කරන ලද කොන්දේසි හා විධිවිධාන සහිත ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. එසේම නීතිපති දෙපාර්තමේන්තුව විසින් සකස් කර අනුමත කර තිබුණු බදු ඔප්පුවේ බදු කාල සීමාව වර්ෂ දෙකක් වුවත් නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධිකාරිය විසින් බදු කාලය වර්ෂ 20 ක් ලෙස සංශෝධනය කර තිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751 සහ 753	සියඹලාන්ඩුව ඇතුළු තවත් ප්‍රදේශ කිහිපයක ජනතාවට බෙදාදීමේ අරමුණින් අධිකාරිය විසින් රු.මිලියන 3.84 ක් වැයකර 2022 පෙබරවාරි සහ මාර්තු මස LED බල්බ 20,000 ක් මිලදීගත් බව දක්වා තිබුණද එම බල්බ කොග පොත්වල සටහන් කර විධිමත්ව වගකිව යුතු නිළධාරීන්ට නිකුත්කර නොතිබුණි.එසේම එම බල්බ ජනතාවට ලබාදුන් බවට සනාථ වන කිසිදු ලේඛණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.
(ඈ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ	අධිකාරියේ ස්ථාවර වත්කම් වර්ෂ 5 කට වරක් තක්සේරුකර සාධාරණ වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.
(ඉ)	2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛය	අධිකාරිය විසින් 2019 සහ 2021 වර්ෂවල වාහන අපහරණයෙන් උපයා තිබුණු රු. මිලියන 3.82 ක් 2023 සැප්තැම්බර් දක්වාම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

(i) ලංකා විදුලි බල මණ්ඩලයේ මධ්‍යම ජාලයේ පවතින ධාරිතාවය (Available Grid Capacity) ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට විසඳුම් ලෙස අධිකාරි පනතේ 5 (ඇ) වගන්තිය ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර වූ (off grid) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් පනතේ 25 (අ) වගන්තිය ප්‍රකාරව 2023 සැප්තැම්බර් වන විටත් මධ්‍යම ජාලයෙන් බැහැර කිසිදු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කිරීමට හැකි වී නොතිබුණි.

(ii) අධිකාරිය විසින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා බලශක්ති බලපත්‍ර නිකුත්කිරීම වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මෙගා වොට් 6,128 ක් වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 1,268 ක් සඳහා රු.මිලියන 280 ක ලියාපදිංචි ගාස්තු අයකර තිබුණද 2023 අගෝස්තු වන විටත් අදාල අයදුම්කරුවන් වෙත බලශක්ති බලපත්‍ර නිකුත් කර නොතිබුණි. තවද 2022 ජනවාරි 04 දිනැති අංක 2261/18 අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3.5 වගන්තිය ප්‍රකාරව ලිපි ලේඛනවල අඩුපාඩු පවතින අයදුම්කරුවන් හඳුනාගෙන ඔවුන්ගේ තාවකාලික ලියාපදිංචිය අවලංගු කිරීමට සහ ලිපි ලේඛණ

සම්පූර්ණ අයදුම්කරුවන් වෙත කඩිනමින් බලශක්ති බලපත්‍ර නිකුත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) පනතේ 8 වගන්තිය අනුව එක් එක් ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවත් අධිකාරිය පිහිටුවා වසර 16 ක් ගත වී තිබුණද 2023 සැප්තැම්බර් වන විටත් එවැනි සැලැස්මක් ගැසට් කර නොතිබුණි.

(iv) පනතේ 19 (1) වගන්තිය යටතේ මධ්‍යම ජාලය තුල වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් වාර්ෂිකව රාජ්‍ය භාගයක් අයකල හැකි වුවත් ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි සකස්කර අදාල ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(v) කුඩා ජල විදුලි ව්‍යාපෘති 13 ක් සඳහා පනතේ 30 වගන්තිය යටතේ 2011-2022 කාලසීමාව තුල හෙක්ටයාර් 11.4 ක් වූ ඉඩම් අධිකාරිය විසින් ඉඩම් අත්පත්කරගැනීමේ පනත යටතේ අත්පත්කරගෙන තිබුණද පනතේ 32 වගන්තිය ප්‍රකාරව එලෙස අත්පත්කරගත් ඉඩම් විධිමත්ව බදු දීම හෝ භුක්තිය භාර දීම සිදු කර වාර්ෂික බදු මුදල් අයකර නොතිබුණි.

(ආ) 2019 අගෝස්තු 9 දිනැති අංක 2135/61 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග සංග්‍රහයේ අංක 4 හි සඳහන් කාලරාමුව යටතේ දක්වා තිබුණු ඉලක්ක සහ සංධිස්ථාන සහ ආයතනික වගකීම් අදාල වගකීම් පවරා තිබුණු ආයතන විසින් දෙවසරකට වරක් සමාලෝචනය කළ යුතු වුවත් අධිකාරිය වෙත නෛතිකව පවරා දී තිබුණු වගකිව යුතු කාර්යයන් 10 ක් සම්බන්ධයෙන් කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) අධිකාරිය විසින් ප්‍රධාන කාර්යාලය සඳහා බලශක්ති කාර්යක්ෂමතාවය සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ සඳහා වන අධිකාරී බලය සහිත ප්‍රසම්පාදන කමිටුවක අනුමැතිය ලබාගෙන නොතිබුණි. ගොඩනැගිල්ලේ නිර්මාණ සැලසුම් වෙනුවෙන් 2020 වර්ෂය දක්වා රු.මිලියන 23.3 ක් වැයකර තිබුණි.තවද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා 2023 සැප්තැම්බර් දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොතිබුණු අතර ඒ හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භකිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මේ වන විට උක්ත වියදම අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. මේ සඳහා රු. මිලියන 41 ක් වැයකර 2015 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් 30 අවුරුදු බදු පදනමට බත්තරමුල්ල ප්‍රදේශයෙන් ඉඩමක් ලබාගෙන තිබුණි. අදාල බදු ගිවිසුමේ කොන්දේසි අංක

1.8 ප්‍රකාරව ගිවිසුම්ගත දිනයේ සිට මාස 3 ක් ඇතුලත ඉදිකිරීම් ආරම්භකර වර්ෂ 2 ක් තුල ඉදිකිරීම් අවසන් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් බදු දේපලේ සන්තකය නැවත නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී තිබුණි.

(ආ) හම්බන්තොට සූර්යබල උද්‍යානයේ හෙක්ටයාර් 20.23 ක් වූ ඉඩමින් කි.වොට් 1,237 ක ධාරිතාවයක් සහිත ගොන්නොරුව I සහ II බලාගාර දෙක සඳහා හෙක්ටයාර් 4 ක් පමණ භාවිතයට ගනිමින් පැවතුණු අතර ඉතිරි ඉඩම් කොටස සූර්යබල උත්පාදන ව්‍යාපෘති සඳහා භාවිතාකිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.


2.3 වෙනත් කරුණු

(අ) විදේශ ව්‍යාපෘතියක් යටතේ අධිකාරිය වෙත ලැබී තිබුණු මුදල්වලින් 2010 සහ 2011 වර්ෂවලදී 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2000 ජනවාරි 11 දිනැති අංක PF/PE/5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව අධිකාරියේ සේවකයන්ට ගෙවන ලද රු. මිලියන 3.1 ක වෘත්තීය දීමනාව නැවත අයකර ගත යුතු ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ 2012 දෙසැම්බර් 03 දිනැති අංක PE/IA/22/VOL.II දරන ලිපියෙන් අධිකාරියේ සභාපති වෙත දන්වා තිබුණද 2023 සැප්තැම්බර් වන විටත් අදාල මුදල් අයකර නොතිබුණි.

(ආ) 2007-2009 වර්ෂවල විදුලි වාහන 3 ක් නිෂ්පාදනය සඳහා අධිකාරිය විසින් පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 7.8 ක මුදලක් ලබා දී තිබුණි. 2012 දෙසැම්බර් 7 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවට මේ සම්බන්ධව අධිකාරිය විසින් වැරදි තොරතුරු ලබාදී තිබුණු අතර මෙම කාර්යයට සම්බන්ධ නිළධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, මේ සම්බන්ධ සත්‍ය තත්ත්වය ප්‍රධාන ගණන්දීමේ නිළධාරී මහින් පොදු ව්‍යාපාර කාරක සභාව වෙත දැනුම් දීමටත් විගණකාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2013 ජනවාරි 4 දින පැවති කමිටු රැස්වීමේදී තීරණය කර තිබුණි. කෙසේ නමුත් මීට සම්බන්ධ නිළධාරීන්ට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර 2023 සැප්තැම්බර් වන විටත් අදාල කාර්යය අවසන් කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

2022 වසරේ විගණකාධිපති වාර්තාව සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිරීක්ෂණ



2023.12.20

විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය,

306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල.

<u>ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>

උක්ත කරුණට අදාළව 2023.11.30 දින ඔබ විසින් එවන ලද විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමග ඉදිරිපත් කරමි.

1.2. <u>මතය සඳහා පදනම</u>

(අ) පුනරීන් ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට අවශ්‍ය වන්දි ගෙවීම සඳහා ලබාදුන් රු. 46,750,000/- ක මුදල එම ව්‍යාපෘතිය උදෙසා 2022 වර්ෂයේ දරණ ලද වියදමක් ලෙස ගිණුම් ගත කරන ලද්දේ එම වර්ෂයේ ආදායමට එරෙහිව කරන ලද වියදමක් බැවිනි.

මෙහි සමස්ථ අපේක්ෂිත වියදම රු.187,000,000/- ක් වන අතර, සමස්ථ වියදම එකම වර්ෂයකදී දැරීම තුලින් එම වර්ෂයේ විශාල අලාභයක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වනු ඇති බැවින්, ගෙවීම් කරනු ලබන වර්ෂයේ දී එම ආදායමට එරෙහිව වියදමක් ලෙස සටහන් කරනු ලැබිණි.

(ආ) පුනරීන් ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා දරණ ලද සමීක්ෂණ ගාස්තු සහ ව්‍යාපෘතිය ශක්‍යතා අධ්‍යයන වියදම් මෙම ව්‍යාපෘතිය අවසානයේ දී නිර්මාණය වන පුනරීන් සුළං බල ව්‍යාපෘතිය නමින් ප්‍රාග්ධනිත කිරීමේ අරමුණින් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කරන ලදී. මෙම සමීක්ෂණ ගාස්තු සහ ශක්‍යතා අධ්‍යයන වියදම් ව්‍යාපෘති වියදම් ලෙස ගිණුම් ගත කළ හොත් මෙම වියදම් දැරීමෙන් නිර්මාණය වන පුනරීන් ව්‍යාපෘතිය සඳහා අධිකාරිය වැය කරන සම්පූර්ණ මුදල මගින් අවසානයේ නිර්මාණය වන වත්කම් පිළිඹිමු නොවන බව අපගේ මතය වේ.

(ඇ) බලශක්ති සංරක්ෂණ අරමුදල 1984 දී පමණ ආරම්භ කර ඇති අතර, 2007 වර්ෂයේ දී එය සුනිත්‍ය බලශක්ති අධිකාරිය බවට පත් විය. එබැවින් සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ස්ථාවර වත්කම් ලෙජරය තුල 1984 වර්ෂයේ සිට ඉදිරියට පැමිණෙන ශේෂයන් ඇතුලත් වුනත්, ස්ථාවර වත්කම් ලේඛනයක් නිවැරදිව යාවත්කාලීන නොවී තිබීම හේතුවෙන් එක් එක් අයිතමයේ පිරිවැය හඳුනාගැනීම අපහසු වී ඇත. මෙම ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා කිහිප අවස්ථාවකදීම උත්සාහ කරන ලදි. එමෙන්ම 2020 හා 2021 වර්ෂයන් වල දී ශ්‍රී ලංකාවට බලපෑ Covid – 19 ව්‍යසනය හේතුවෙන් ආයතනයේ භෞතිකව පවතින ස්ථාවර වත්කම් හඳුනාගැනීම සිදු කළ නොහැකි විය.

මෙය 2009 වර්ෂයෙහි හෝ 2010 වර්ෂයේ දී ඉදිකරන ලද අතර, ස්ථාවර වත්කම් ලේඛනය 2022 වර්ෂයේ දී නිම කරන ලදී. කෙසේ නමුත් 2023 වර්ෂයේ දී විදුලි වැට ප්‍රත්‍යාගණනය කර, මූල්‍ය ප්‍රකාශන වල දී ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

(ඇ) මෙය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත

(ඉ) සුනිත්‍ය බලශක්ති අරමුදලේ ඉතුරුම් තැන්පතුවල අඩු පොලී ආදායම් යටතේ පැවැති මුදල් 2022 වර්ෂයේ දී ඉහළ පොලී අනුපාතයක් ලබාගැනීම සඳහා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලදී. මෙම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගැනීමට යොමු කරන ලද අතර, 2022/12/31 දිනට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු. මිලියන 678.5 ක ආයෝජනය සඳහා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලැබිණි.

මෙහිදී සමහර ආයෝජනයන් වසරකට වඩා අඩු කල්බරිත තැන්පතුවල ආයෝජනය කළත්, ඒවා නැවත ආයෝජනය කිරීමේ පදනම මත ආයෝජනය කර තිබූ බැවින් සියලුම ආයෝජනයන් ආයෝජිත යටතේ පෙන්නුම් කිරීමට කටයුතු කරනු ලැබින.

(ඊ) සුනිත්‍ය බලශක්ති අරමුදලේ ඉතුරුම් තැන්පතුවල අඩු පොලී ආදායම් යටතේ පැවැති මුදල් 2022 වර්ෂයේ දී ඉහළ පොලී අනුපාතයක් ලබාගැනීම සඳහා ස්ථාවර තැන්පතුවලට ආයෝජනය කරන ලදී. මෙම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගැනීමට යොමු කරන ලද අතර, 2022/12/31 දිනට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු. මිලියන 678.5 ක ආයෝජනය සඳහා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලැබිණි.

මෙහිදී සමහර ආයෝජනයන් වසරකට මාස තුනකට වඩා අඩු කල්බරිත තැන්පතුවල ආයෝජනය කළත්, ඒවා නැවත ආයෝජනය කිරීමේ පදනම මත ආයෝජනය කර තිබූ බැවින් සියලුම ආයෝජනයන් ආයෝජිත යටතේ පෙන්නුම් කිරීමට කටයුතු කරනු ලැබින.

(උ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අය කරනු ලබන බලපත්‍ර ගාස්තුව එක් වරක් පමණක් අය කරනු ලබන ගාස්තුවකි. මෙම බලපත්‍ර ගාස්තුව හුවමාරු ගනුදෙනුවක් නොවේ. එබැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත 10 අනුව ගිණුම්ගත කළ නොහැකි බැවින් එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 11 ට අනුව ගිණුම්ගත කළ යුතු බැවින් මුදල් අය කරනු ලබන වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කරන ලදී. තව ද බලශක්ති ව්‍යාපෘති සඳහා අයදුම් කිරීමේ දී අය කරන ලියාපදිංචි ගාස්තු (අයදුම්පත් ගාස්තු) ද හුවමාරු ගනුදෙනුවක් නොවන බැවින්, අයදුම් කිරීමේ දී අයකරන ලියාපදිංචි ගාස්තු ද මුදල් අයකරන වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කරන ලදී.

(ඌ) බලශක්ති සංරක්ෂණ අරමුදල 1984 දී පමණ ආරම්භ කර ඇති අතර, 2007 වර්ෂයේ දී එය සුනිත්‍ය බලශක්ති අධිකාරිය බවට පත් විය. එබැවින් සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ස්ථාවර වත්කම් ලෙජරය තුල 1984 වර්ෂයේ සිට ඉදිරියට පැමිණෙන ශේෂයන් ඇතුලත් වුනත්, ස්ථාවර වත්කම් ලේඛනයක් නිවැරදිව යාවත්කාලීන නොවී තිබීම හේතුවෙන් එක් එක් අයිතමයේ පිරිවැය හඳුනාගැනීම අපහසු වී ඇත. මෙම ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා කිහිප අවස්ථාවකදීම උත්සාහ කරන ලදි. එමෙන්ම 2020 හා 2021 වර්ෂයන් වල දී ශ්‍රී ලංකාවට බලපෑ Covid – 19 ව්‍යසනය හේතුවෙන් ආයතනයේ භෞතිකව පවතින ස්ථාවර වත්කම් හඳුනාගැනීම සිදු කළ නොහැකි විය.

මෙම කාර්යය 2022 වර්ෂයේ දී නිම කරන ලද අතර, හම්බන්තොට හා ඉඳුරාන වැනි දුරස්ථ පාලන ඒකකයන් ද පිහිටා ඇති බැවින් මෙම කාර්යය නිම කරන විට 2022 වර්ෂය අවසන් වී තිබුණි. එබැවින් 2023 වර්ෂයේ දී ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර සියලුම වත්කම් තක්සේරු කිරීම සඳහා කටයුතු සම්පාදනය කර ඇත. එවිට 2023 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අදාලව තොරතුරු ඉදිරිපත් කිරීමට අප අධිකාරියට හැකි වේ. එමෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3.1 යටතේ නිවැරදි තොරතුරු නොමැති බැවින් වත්කම් ලෙජරයේ පරිදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති බැවින් වත්කම් ප්‍රකාශනය කිරීමෙන් අනතුරුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත.

(එ) ඉහත (ඌ) පිළිතුර හා බැඳේ.

(ඒ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත පුනර්ජනනීය බලශක්ති අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමේ දී එම අයදුම් පත්‍රයේ සඳහන් ධාරිතාවය ම විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙන්නේ නම් (AC Power ලෙස) අයදුම්පත්‍ර ගාස්තුව ලෙස එම ධාරිතාවයට ගණනය කොට අයකළ යුතුය. නමුත් මෙම මෙ.වො. 700 ක ධාරිතාවයකින් යුතු සූර්යය බලාගාරය තුළින් නිපදවෙන විදුලිය බැටරි මත ආරෝපණය කොට පද්ධතියට ලබා දීමට සැලසුම් සකස් කොට ඇත. මේ සඳහා

විදුලි බල මණ්ඩලයෙන් පද්ධතියට AC Power ලෙස සම්බන්ධ කළ හැකි ධාරිතාවය ලබා දුන් පසුව එම ධාරිතාවයට අය කළ යුතු මුළු මුදල බලශක්ති බලපත්‍රය ලබාදෙන මොහොතේ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

මේ අනුව අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී මෙ.වො 100 දක්වා වන ප්‍රමාණයට ගත යුතු මුදල ලබා ගැනීමටත්,මෙ.වො 100 ඉක්මවන ප්‍රමාණයන් සඳහා අදාල මුදල බලශක්ති බලපත්‍ර ඔවුන් වෙත ලබා දෙනු ලබන අවස්ථාවේදී බලපත්‍ර ගාස්තුවට අමතරව අයකර ගැනීමටත් කටයුතු කරන ලෙසට උපදෙස් දී ඇත. ඒ අනුව 2022/04/06 දින මෙ.වො 100 ක් සඳහා අයදුම්පත්‍ර ගාස්තුව වන රු 5,050, 000ක මුදලක් අධිකාරිය වෙත අය කර ගෙන මෙම ව්‍යාපෘතිය ලියාපදිංචි කර ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය මේ වන විට පරිසර අධ්‍යයන වාර්තාව පිලියෙල කිරීමේ වැඩකටයුතුවල නිරත වී සිටින අතර එය අවසන් වූ විගස බලශක්ති බලපත්‍රය ලබා ගැනීමට අයදුම් කරනු ඇත. ඒ අනුව ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව බලශක්ති බලපත්‍රය නිකුත් කරන අවස්ථාවේදී බලශක්ති බලපත්‍ර ගාස්තුවට අමතරව අයදුම්පත්‍ර ගාස්තුවේ හිඟ මුදල ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත අය කර ගැනීමට කටයුතු කරනු ඇත.

(ඔ) පුනරීන් සහ මන්නාරම දෙවන අදියර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් ප්‍රතිපූර්ණය සඳහා ඉන්දීය විදේශ ආයෝජන සමාගම වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ , සඳහා අයපතක්(Invoice) නිකුත් කර නොමැති බැවින් 2022 මුල්‍ය ප්‍රකාශනවල අදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු නොකරන ලදි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2 යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

(අ) 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධකාරී පනතේ 4 (අ) අනුව බලශක්ති සුරක්ෂිතාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා සංවර්ධනය කිරීම හා ඒ මඟින් රටට ආර්ථික සහ සමාජ ප්‍රතිලාභ ව්‍යාප්ත කිරීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්ථාපිත කිරීමේ ප්‍රධාන පරමාර්ථයක් වේ.

ඒ අනුව පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය උදෙසා කාලෝචිත නව තාක්ෂණයන් හඳුන්වාදීමේ අභිලාෂය සහිතව අධිකාරිය විසින්ම ව්‍යාපෘති 5 ක් ආරම්භ කර ඇත.

(i) ඉදුරාන කුඩා ජල විදුලි බලාගාරය

මෙය බලශක්ති සංරක්ෂණ අරමුදල ක්‍රියාත්මක වූ කාලයේ පටන් NERD ආයතනයන් සමඟ එක්ව නියමු ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීමට ආරම්භ කරන ලද අතර ඒ වන විට

පෞද්ගලික අංශය මඟින් ක්‍රියාත්මක ජල විදුලි බලාගාර සංවර්ධනය වී පැවතුන ද ක්ෂුද්‍ර (Micro) පරිමාණයේ ජල විදුලි බලාගාර පැවතියේ මධ්‍යම ජාලයෙන් පිටත ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ලෙස පමණි. 2006 වර්ෂයේ රට තුල පැවති බලශක්ති අර්බුදය හේතුවෙන් මෙම ජල විදුලි බලාගාර අවශ්‍යතාවය රට තුලින් තදින් පැවතුනි.

එම කාල සීමාවේ දී ප්‍රථම මධ්‍යම ජාලයට සම්බන්ධිත ක්ෂුද්‍ර (Micro) පරිමාණ ජල විදුලි ව්‍යාපෘතියක් ලෙස ඉදුරාන ජල විදුලි බලාගාරය මධ්‍යම ජාලයට සම්බන්ධ කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට හැකිවීමත් සමඟම පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් එවැනි ව්‍යාපෘති සංවර්ධනය කිරීමට වඩාත් නැඹුරුවීමක් ඉන්පසුව ඇති විය.

(ii) හම්බන්තොට කොරියානු හා ජපන් ආධාර යටතේ සංවර්ධනය වූ. 500 kW හා 737 kW ධාරිතාවයෙන් යුතු සූර්යබල ව්‍යාපෘතීන්

ලෝකයේ සූර්යබල ව්‍යාපෘති ප්‍රචලිත වූ මුල් කාලයේ දී ශ්‍රී ලංකාවේ ද බලශක්ති ක්ෂේත්‍රයේ නව ගමනක් ආරම්භ කරමින් මෙම ව්‍යාපෘති 02 ක සංවර්ධනය කිරීම සඳහා ආධාර කොරියන් රජය හා ජපන් රජය මඟින් ලබා දෙන ලදී.

මෙම ව්‍යාපෘති 02 ක ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා අධිකාරිය විසින් වසරක පමණ කාලයක් තුල දැරූ උත්සහයේ ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘති 02 රටට ලැබුණි.

මෙම ව්‍යාපෘති දෙක නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දීම තුළින් වාණිජ මට්ටමේ සූර්ය බල ව්‍යාපෘති සංවර්ධනය කිරීමට ආයෝජකයින් දිරිමත් වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මේ වන විට සූර්යබල තාක්ෂණයෙන් සංවර්ධනය වූ ව්‍යාපෘති මඟින් මෙ.වො. 900 ක ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කර ඇති අතර එය 2022 වර්ෂයේ සමස්ථ විදුලි ජනනයෙන් 2% ක ප්‍රතිශතයකට ආසන්න වී ඇත.

තවද, වසරකට විශ්ව විද්‍යාල හා පාසල් සිසුන් 2500-3000 කට ආසන්න ප්‍රමාණයක් මෙම බලාගාරය අධ්‍යයන චාරිකාවක් ලෙස නැරඹීමට පැමිණෙන අතර ශ්‍රී ලංකාවේ සූර්ය බල තාක්ෂණය පිළිබඳ තාක්ෂණික පාඨමාලා සඳහා වන එකම ප්‍රායෝගික පුහුණු මධ්‍යස්ථානය මෙය වේ.

(iii) ගන්නෝරුව (iii) හා ගන්නෝරුව (iv) ව්‍යාපෘතීන්

2011 වර්ෂයේ සිට සූර්යබල තාක්ෂණයෙන් යුතු ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා උනන්දුවක් දැක්වූ පාර්ශවයන්ට හා ලංකා විදුලිබල මණ්ඩලයට ප්‍රධාන ගැටළුවක් වූ දහවල් කාලයේ දී පමණක් විදුලිය නිෂ්පාදනය කිරීම සහ රාත්‍රී කාලයේ දී එම ධාරිතාවය පද්ධතියට අහිමි වීම සහ වලාකුළු/කාළගුණ තත්වය මත සූර්යබල ව්‍යාපෘතීන් මඟින් ජනනය වන ධාරිතාවය ක්ෂණිකව කඩා වැටීම (sudden drop) හේතුකොට ගෙන ජාතික පද්ධතියට සිදුවන බලපෑම් හේතුවෙන්

ඒ සඳහා බැටරි මඟින් යම් කාලසීමාවක් සඳහා ධාරිතාවය සැපයීමේ තාක්ෂණයෙන් යුතුව ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පැන නැඟුනි.

නමුත් ඒ වන විට ලංකාව තුල එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් හා ඒ සඳහා විශාල ප්‍රාග්ධන පිරිවැයක් දැරීමට සිදුවන හෙයින් පෞද්ගලික අංශය සෘජුවම මේ සඳහා දායක වීමට උනන්දුවක් ඇති නොවීය.

ඉහත කී අධිකාරියේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ආයතනයේ කාර්යයන් ක්‍රියාත්මක කල යුතු බැවින් මේ සඳහා නියමු ව්‍යාපෘතියක් ඇති කිරීමට අපේක්ෂා කරන ලද අතර ඒ සඳහා වන ප්‍රාග්ධන පිරිවැය දැරීමට අධිකාරියට හැකියාවක් නොපැවතුනි. එබැවින් පනතේ 5 (ග) අනුව විෂයභාර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව මේ සඳහා පෞද්ගලික අංශය සමග ඒකාබද්ධ යෝජනා ක්‍රමයක් අනුව මෙම සියළු ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීමට අදාල අනුමැතීන් ලබා ගන්නා ලදී.

- බලශක්ති බලපත්‍රයක් නොමැතිව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සිදු කිරීමට නොහැකි බැවින් ඉහත ව්‍යාපෘතීන් 5 සඳහා අධිකාරිය විසින් බලශක්ති බලපත්‍ර නිකුත් කර ඇත.
- මෙයින් ව්‍යාපෘති 3 ක් මේ වන විට විදුලිය උත්පාදන කටයුතු සිදු කර නිබුන ද ඒකාබද්ධ ව්‍යාපෘතීන් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කල බැටරි සහිත සුර්ය බල ව්‍යාපෘතීන් සඳහා බලශක්ති මිලදී ගැනීමේ ගාස්තු ක්‍රමයක් (Tariff) නොමැති වීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.
- අනිකුත් ව්‍යාපෘති මහා පරිමාණ බලශක්ති උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂාවෙන් අයදුම් කර ඇත.

(ආ) (i) මෙය ශ්‍රී ලංකා එනජීස් හරහා සිදුකරන ලද බදවාගැනීමක් වන බැවින් එම ආයතනයේ ක්‍රමවේද අනුව මුදල් ගෙවීමට සිදුවී ඇත.

(ii) 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතේ 18 (4) වගන්තිය යටතේ ව්‍යාපෘති සඳහා අවසාන අනුමැතිය අවුරුදු 20 සඳහා ලබා දිය යුතු අතර එම ව්‍යාපෘතිය සඳහා ඉඩම බදු දීම අදාල කාල සීමාව ආවරණය විය යුතු බැවින් වසර 20 සඳහා ගිවිසුම් අත්සන් කර ඇත.පනතේ 32 (1) යටතේ v වන පරිච්ඡේදය යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක කාර්ය සඳහා බදු දිය යුතු බව ප්‍රකාශිතව දක්වා ඇති හෙයින් එකී කාල සීමාව අවුරුදු 20 ක් විය යුතු අතර ඊට පටහැනි නියමයන් ඇතුලත් කල නොහැකි බැවින් අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමේදී එකී වගන්ති ඇතුලත් කර අනුමැතිය ලබා ගෙන ඇත.මෙම ආයතනයේ නිසි බලධාරියා අධ්‍යක්ෂ

ජනරාල්වරයා වන බැවින් ඔහුගේ අනුමැතිය යටතේ නීතිපති අනුමැතිය ලබා ගෙන ඇත.අවසානයේ කළමනාකරණ මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබා ගනු ලැබේ.

(ඇ) මෙම කාරණයට අවශ්‍ය කරුණු අධ්‍යනය කර අභ්‍යන්තර විමර්ශනයක් සිදු කරන අතර අතර ඉදිරි කාලයේදී එය විගණකාධිපති තුමා වෙත ලැබීමට සලස්වනු ලැබේ.

(ඈ) ඉහත 1.2 (උ) පිළිතුර හා බැඳේ.

(ඉ) මෙම මුදල 2023 දෙසැම්බර් මස මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කර ඇත.

2.2.3 අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

(අ) 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

(i) මධ්‍යම ජාලයෙන් බැහැර වූ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම 2007 සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන වකවානුව තුල ප්‍රමුඛ අවශ්‍යතාවයක් වුවත් ක්‍රමයෙන් රටෙහි සියලුම ප්‍රදේශ මධ්‍යම ජාලයට සම්බන්ධ වූ නිසා අද වන විට මෙම අවශ්‍යතාවය අල්ප වී ඇත.එසේම මේ සඳහා කිසිම ආකාරයකින් ඉල්ලීමක් මේ වන තුරු ලැබී නොමැත.නමුත් මෙවැනි ව්‍යාපෘති කිරීමට අවශ්‍ය තාක්ෂණික දත්තයන් දැනටමත් ප්‍රසිද්ධ කර ඇත.එසේම මෙම අධිකාරිය යටතේ නකල්ස් කඳුකරය තුල තිබෙන ගම්මාන තුනෙන් එකක් සඳහා මධ්‍යම ජාලයෙන් බැහැර වූ සුර්යබල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇති අතර ඉතිරි ගම්මාන දෙක සඳහා ද එවැනි පද්ධති සවි කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කරමින් පවතී.

(ii) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් ලියාපදිංචියේ සිට බලශක්ති බලපත්‍රය ලබාගැනීම දක්වා වූ ක්‍රියාවලිය තුල කඩයිම් කිහිපයක් ඇති අතර, අවසානයේදී, ලියාපදිංචිවූ ව්‍යාපෘති අතරින්, බලශක්ති බලපත්‍රය ලබාගන්නේ සීමිත ව්‍යාපෘති ප්‍රමාණයකි. පාරිසරික සහ සාමාජීය ගැටළු, ඉඩම් ලාබාගැනීමේ දුෂ්කරතාවයන්, මුලින් එකඟවූ ආයෝජකයින් පසුව එකඟ නොවීම වැනි කරුණු නිසා, ලියාපදිංචිවූ ව්‍යාපෘති බොහෝ ප්‍රමාණයකට, බලශක්ති බලපත්‍ර ලබගැනීමට නොහැකිවේ. එසේම, 2013 වසරේ විදුලිබල පනතේ සංශෝධනය සහ 2017 වසරේ නීතිපතිවරයා විසින් ඒ සම්බන්ධව ලබාදුන් අර්ථනිරූපනය නිසා, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව, සම්මත අයක්‍රමය (feed-in tariff) යටතේ ලියාපදිංචිවී තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීය. මේ ආකාරයේ රාජ්‍ය ප්‍රතිපත්තිවල විෂමතාවය නිසා, එනම් සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ සහ විදුලි බල පනතේ එකිනෙකට වෙනස් ක්‍රමවේද ඉදිරිපත්කිරීම නිසා රටට

ලැබියයුතුවූ පුනර්ජනනීය බලශක්තිය අහිමිවිය.

2022 වර්ෂයේ විදුලි බල පනතේ වෙනස්කිරීමත් සමගම, නැවත, සම්මත අයක්‍රමය යටතේ, පුනර්ජනනීය ව්‍යාපෘති සංවර්ධනයට ඉඩ සැලසුනද, එම ව්‍යාපෘති සඳහා, ජාල ධාරිතාවය ලබාදීම පිළිබඳ නිර්දේශ, ලංකා විදුලිබල මණ්ඩලය මගින් ප්‍රකාශයට පත්කෙරුනේ 2022 නොවම්බර් මාසයේදීය. කෙසේ වෙතත් එම කාලයේදී පැවති ආර්ථික අර්බුධය සහ රුපියලේ අගය අවප්‍රමාණ වීම නිසා, දී ඇති අයක්‍රමයන් තවදුරටත් වලංගු නොවන තත්වයක් පැවතින. කෙසේ වෙතත්, පවතින ආර්ථික තත්වයන් අනුව යාවත්කාලීනකල සහ බැංකු පොලිය සහ අනෙකුත් එවැනි පරාමිතීන් අනුව වෙනස්වන අයක්‍රම හඳුන්වා දෙනු ලැබුවේ 2023 මැයි මාසයේදී පමණය. එබැවින්, ඉන් පසුව, වලංගු කාලසීමාව ඉක්මවූ තාවකාලික බලත්‍ර සහිත ව්‍යාපෘති අවලංගු කිරීම මේ වනවිට ක්‍රියාත්මකකර ඇති අතර, නියමිත කාලය තුල ඉදිකිරීම්වල සාධාරණ ප්‍රගතියක් නොමැති ව්‍යාපෘතිවලට සිනි කැඳවීමේ ලිපි යවා, ඉන් පසුව අවශ්‍යනම් අවලංගුකිරීමේ කටයුතු මේ වනවිට ආරම්භකර ඇත. එසේම, නියමිත පරිදි ලියකියවිලි ඉදිරිපත්කර ඇති ව්‍යාපෘති සඳහා, නියමිත ක්‍රියා පටිපාටියෙන් පසුව බලශක්ති බලපත්‍ර ලබාදීමට මේ වනවිට පියවර ගෙන ඇත.

(iii) 2020 වසර තුලදී පනතෙහි 8 වන වගන්තිය අනුව පුනර්ජනනීය බලශක්ති සැලස්ම සකස් කරන ලද අතර, 2021 ජූලි 21 වන දින මහජන අදහස් ලබා ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. මහජන අදහස් අනුව සම්පූර්ණ කරන ලද පුනර්ජනනීය සංවර්ධන සැලස්ම භාෂා ත්‍රිත්වයෙන් 2021 නොවැම්බර් 26 වන දින ලේකම්, සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.
අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා පසු විපරම් සිදු කරමින් පවතින අතර, අනුමැතිය ලද වහාම ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

(iv) අධිකාරියේ අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා පැනවිය හැකි රාජ්‍ය භාගය අයකර ගැනීම සඳහා මෑත කාලීන අවස්ථා 02 දී කැබිනට් පත්‍රිකා පිළියෙල කොට අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත. එහෙත් ඒ ඒ අවස්ථාවලදී රට තුල ඇති වූ තත්වයන් මත මෙය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

(v) අධිකාරිය විසින් භුක්තිය භාර ගන්නා ලද ඉඩම් කැබලි 45 න් ඉඩම් කැබලි 16 ක් නිවැරදිව බදු දී ඇති අතර ඉතිරි ඉඩම් කැබලි 29 පනතේ 9 වැනි වගන්තිය යටතේ නිමිකම් පරීක්ෂණ අවසන් කිරීමෙන් පසුව රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් පසු හිඟ බදු මුදල් ද සමඟ නියමිත බදු මුදල් අය කිරීමට කටයුතු කරන බව දන්වමි.

සිරිඔය කුඩා ජල විදුලි බලාගාරය සඳහා අවශ්‍ය ඉඩම් පනතේ විධිවිධාන අනුව අත්පත් කරගෙන නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිසි පරිදි බදු ගිවිසුමක් අනුමත කර ගැනීමෙන් පසු අදාල කාලවකවානුව තුල අධිකාරිය අයත්ව තිබූ සූර්යබල සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් ව්‍යාපෘති යෝජක සමඟ බදු ගිවිසුම් ඇති කර ගන්නා ලදි. කෙසේ නමුත් ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මෙතෙක් ආරම්භ වී නොමැති අතර බදු මුදල් ගෙවන ලෙසට අධිකාරිය අදාල ව්‍යාපෘති යෝජක දැනුවත් කර ඇත. අදාල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම අධිකාරියේ පාලනයෙන් තොර හේතු මත සිදු ව ඇත.

(ආ) මේ යටතේ ඉටු කල යුතු කාර්යයන් හා වගකීම් අධිකාරියේ එක් එක් අංශයන්ට බෙදා දී ඇත. ඒ සම්බන්ධ ප්‍රගතිය විමසීමක් අදාල අංශය වෙත යොමු කර ඇති අතර එය ලැබූ වහාම සම්පූර්ණ වර්තාවක් විගණකාධිපති තුමා වෙත යොමු කිරීමට බලාපොරොත්තු වේ.

2.2.4 සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර බාධිතා කර ඇති බව

(අ) අමාත්‍යාංශයේ මගපෙන්වීම අනුව අධිකාරියේ ප්‍රධාන කාර්යාලය කොළඹ නගරයේ පිටත ස්ථාපනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව ලේකම්වරයා සිදුකරනු ලැබූ දැනුම්දීමකට අනුව ක්‍රියාත්මක වී මෙම ඉඩම් කොටස අධිකාරිය විසින් බදු ගන්නා ලද්දේ 2015.06.22 දිනය.

කුලි පදනම මත කාර්යාලය පවත්වාගෙන යාමට වඩා අඩු පිරිවැයකින් ඉමහත් මුදල් ඉතිරියකට හේතුවන බැවින් මෙම ව්‍යාපෘතිය ඉතා වැදගත් විය.

මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා ගොඩනැගිල්ල මනාව සැලසුම් කලයුතු වන අතර ඒ සඳහා අවශ්‍ය වෘත්තිය සේවා ලබාගනීමට ඒ පිලිබඳ ජාතික ආයතනය වන ශ්‍රී ලංකා වස්තු විද්‍යාඥයින්ගේ සංගමයේ උපදෙස් පරිදි කටයුතු කරන ලදී.ඇස්තමේන්තු මුදලින් නියමිත ප්‍රතිශතයක් වන ගොඩනැගිලි නිර්මාණ ගාස්තුව පමණක් අදාල වාස්තු විද්‍යාඥයා හට ගෙවා ඇත.මේ අයුරින් පිළියෙළ කෙරුණු ඇස්තමේන්තු සහිතව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවසර පත කැබිනට් පත්‍රිකාවක් 2022.02.18 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. COVID වසංගතය හා රටෙහි පවතින්නාවූ ආර්ථික අර්බුදය හේතුවෙන් අමාත්‍යාංශ ලේකම් වරයාගේ උපදෙස් පරිදි මෙම ව්‍යාපෘතිය කල් දැමීමට තීරණය කොට ඇත. බදු කොන්දේසි සංශෝධනය සඳහා අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට සියවර ගෙන ඇත.

(ආ) හම්බන්තොට ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ නියමු ව්‍යාපෘතියක් ලෙස සහ පුහුණු මධ්‍යස්ථානයක් අරමුණු කරගනිමිනි .ඒ සඳහා බලාගාර දෙක සමඟ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට යෝජිතව තිබූ නමුත් රජය මගින් ප්‍රතිපාදන ලබා දීම නවතා ඇත .එහෙත් බලාගාර

පරිශ්‍රය තුල පුහුණු කටයුතු වසර පුරා සිදුකරනු ලබන අතර ඒ සඳහා බාහිර ස්ථාන වල නේවාසික පහසුකම් ලබාගනී .නව සූර්ය තාක්ෂණය භාවිතා කරමින් නව ව්‍යාපෘති ස්ථාපිත කිරීමට යෝජනා වී ඇති අතර දැනට 500kW ධාරිතාවයකින් යුත් පොලව මත ඉදිකරන සූර්ය බලාගාරයක් 'Power Wheeling' තාක්ෂණය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ඉදිකිරීමට අවශ්‍ය සියලු වැඩකටයුතු සම්පාදනය කර ඇත.

2.3 වෙනත් කරුණු

(අ) Switch Asia ව්‍යාපෘතිය යටතේ අධිකාරිය වෙත ලැබුණු මුදලින් 2010 සහ 2011 වර්ෂවල දී අධිකාරියේ සේවකයන්ට ගෙවන ලද රු.3,135,202.00 ක වෘත්තීය දීමනාව අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි නැවත අයකර ගැනීමටත් එම වැඩසටහන වෙනුවෙන් නිශ්චිතව යෙදුණු නිලධාරීන්ට රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ 2021/07/27 දිනැති අංක: SMRC/FIN/SLSEA/2021 ප්‍රකාරව ලබාදීමටත් කටයුතු කරමි.

(ආ) මෙම ව්‍යාපෘතිය පිළිබඳ ගැටළුව ජාතික බේරුම්කාරක සභාව (National Arbitration Council) වෙත යොමු කරන ලදුව එහිදී ඇති වූ සාකච්ඡා මත පදනම්ව විදුලි රථ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් ලෙස එක් ආකෘතියක් අධිකාරිය වෙත ලබා ගැනීමෙන් මෙම ගැටළුව විසඳා ගැනීමට මණ්ඩලය විසින් 2022.11.21 දින තීරණය කොට ඇත.ඒ අනුව මෙම ක්‍රියාවලිය කරගෙන යනු ලැබේ.

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ආයතනික තොරතුරු

අධිකාරියේ නම
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

නීතිමය තත්ත්වය
2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත අධිකාරියකි.

ලියාපදිංචි කල කාර්යාලය
72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07
දුරකථන : 0112575203 / 0112575030
ෆැක්ස්: 0112575089
විද්‍යුත් තැපෑල: info@energy.gov.lk
වෙබ් අඩවිය : www.energy.gov.lk